91/211/3/2017/02/S/ADCH/06

රහස්‍යය යි

සංශෝධනයන්ට යටත්ය

2561 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2016 (2017)

ලකුණු දීමේ පටිපාටිය



(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය

ඇගයීම් (ආයතනික විභාග) ශාඛාව

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

පැලවත්ත

බත්තරමුල්ල.

Past Papers Wiki

2561 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2016 (2017)

(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය

S 2

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

2. (i) සරණාගමන පැවිද්ද යනු කුමක්දැයි පහදා දෙන්න. *(ලකුණු 04 යි)*
(ii) විනයෙහි සඳහන් පැවිදි කිරීමට නුසුදුසු පුද්ගලයන් හයදෙනෙකු ලියන්න. *(ලකුණු 06 යි)*
(iii) එම පුද්ගලයන් පැවිද්දට සුදුසු නොවන්නේ කවර හේතු නිසාදැයි පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

3. (i) ධම්මික සූත්‍රයෙහි සඳහන් ගිහි ප්‍රතිපදාවට අයත් ශික්ෂා හතරක් ලියන්න. *(ලකුණු 04 යි)*
(ii) අලසකමේ දෝෂ හය සිඟාලෝවාද සූත්‍රයෙහි එන ආකාරයෙන් දක්වන්න. *(ලකුණු 06 යි)*
(iii) අලසකම වස්තු විනාශයට කෙසේ හේතුවන්නේදැයි විස්තර කරන්න. *(ලකුණු 08 යි)*

4. (i) දීඝජාණු කෝලිය පුත්‍රයා බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ කළ ඉල්ලීම ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දැක්වෙන ලෙස ලියන්න. *(ලකුණු 04 යි)*
(ii) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි සඳහන් මෙලොව හිත සුව පිණිස හේතුවන කරුණු පෙන්වා දී කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 06 යි)*
(iii) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දැක්වෙන 'සද්ධා සම්පදාව' පරලොව දියුණුවට කෙසේ හේතු වන්නේදැයි පහදන්න. *(ලකුණු 08 යි)*

5. (i) සිංහලට නගන්න.
(අ) 'අථ ඛො ධම්මිකො උපාසකො පඤ්චහි උපාසක සතෙහි සද්ධිං යෙන භගවා තේනුපසංකමි'
(ආ) 'වන්දාමි චෙතියං සබ්බං - සබ්බත්‍ථාපොසු පතිට්ඨිතං'
(ඉ) 'සො එවං අත්තනො සබ්බං ධනං විස්සජ්ජෙත්වා දානං අදාසි'
(ඊ) 'අතීතෙ ජම්බුදීපෙ අමරවතී නාම නගරං අහොසි තත්‍ථ සුමෙධො නාම එකො බ්‍රාහ්මණ කුමාරෝ විහරති'
(ලකුණු 08 යි)

(ii) මෙම වාක්‍ය පාලියට නගන්න.
(අ) මෙම දානය අපි භික්ෂු සංඝයාට දෙමු.
(ආ) සියලු සත්වයෝ මියයන්නාහ.
(ඉ) පිදිය යුතු අය පිදීම උතුම් මංගල කරුණකි.
(ඊ) අපි විහාරයට ගොස් බුදුරජාණන් වහන්සේ බලමු.
(උ) අතීතයෙහි බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජතුමා රාජ්‍ය කළේ ය.
(ලකුණු 10 යි)

6. (i) මෙම පාඨය සිංහලට නගන්න.
බොධිසත්තො කපිගණං ආදාය තත්‍ථ ඵලානි ඛාදන්තො එකස්මිං කාලෙ ඉමස්ස උදකෙ පතිත ඵලං නිස්සාය අම්හාකං භයං උප්පජ්ජිස්සතී'ති උදකමත්‍ථකෙ සාඛාය එකං ඵලංපි අනවසෙසෙත්වා පුප්ඵකාලෙ කළායමත්ත කාලතො පට්ඨාය ඛාදාපෙති. *(ලකුණු 08 යි)*

(ii) මහා කපි ජාතකයෙහි දැක්වෙන වඳුරු රජුගේ චරිතය තුළින් පාලකයෙකු තුළ පැවතිය යුතු විශිෂ්ට ගුණාංග කුනක් පහදා දෙන්න. *(ලකුණු 10 යි)*

7. (i) මෙම පාඨය සිංහලට නගන්න.
"කොනුඛො භික්ඛවෙ අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩං අහාරන්තීති? එකච්චෙ බත්තිය කුලා පබ්බජිතා ආහංසු. එකච්චෙ බ්‍රාහ්මණකුලා ගහපති කුලා පබ්බජිතොති, අපරෙ විනයධරො ධම්මකථිකො පඨමස්ස ඣානස්ස ලාභි, දුතියස්ස තතියස්ස චතුත්‍ථස්ස ඣානස්ස ලාභීති, අපරෙ සොතාපන්නො සකදාගාමී අනාගාමී අරහා තෙවිජ්ජො ඡළභිඤ්ඤොා'ති ආහංසු." *(ලකුණු 08 යි)*

(ii) බුද්ධ ශාසනයෙහි වැඩිමහල්ල පිළිවෙළ ක්‍රියාත්මක වන ආකාරය තිත්තිර ජාතකය ඇසුරින් විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

* * *

2561 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2016 (2017)

(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය

ලකුණු දීමේ පටිපාටිය

I කොටස සඳහා ලකුණු	-	**28**
II කොටස සඳහා ලකුණු	-	**72 (18 x 4)**
ලකුණු එකතුව	-	**100**

01 වන ප්‍රශ්නයේ i,ii,iii,iv,v,vi,vii කෙටි ප්‍රශ්නවලට දී ඇති පිළිතුරුවලට ලකුණු 02 බැගින් ද viii,ix කෙටි ප්‍රශ්න සඳහා ලකුණු 04 බැගින් ද x කෙටි ප්‍රශ්න සඳහා ලකුණු 06 ක් ද හිමිවන බැවින් 01 ප්‍රශ්නයට මුළු ලකුණු 28 ක් හිමි වේ.

II කොටසේ ප්‍රශ්න අතුරින් තෝරාගත් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයීම අවශ්‍ය ය.

I කොටස

1. (i) සිට **(vii)** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(i)

(අ) (බ්‍රාහ්මණ / <u>ශ්‍රමණ</u>)

(ආ) (ආජීවක සම්ප්‍රදායයෙහි / <u>ජෛන සමයෙහි</u>)

{ලකුණු 2 යි}

(ii)

(අ) (<u>එක් අයෙකු</u> / දෙදෙනෙකු)

(ආ) (ආරාමික / <u>සංචාරක</u>)

{ලකුණු 2 යි}

(iii)

(අ) (<u>සඳහන්ව ඇත</u> / සඳහන්ව නොමැත)

(ආ) (අට නමකට / <u>සතර නමකට</u>)

{ලකුණු 2 යි}

PAST PAPERS WIKI

(iv)

(අ) (ඇසළ / නිකිණි)

(ආ) (ආරම්භයේ / අවසන් වූ විට)

{ලකුණු 2 යි}

(v)

(අ) (හතක් / දහයක්)

(ආ) (තජ්ජනීය කර්මය / බ්‍රහ්ම දණ්ඩය)

{ලකුණු 2 යි}

(vi)

(අ) (මව්පියන් / ආචාර්යවරුන්)

(ආ) (චතුර්විධ කර්මක්ලේශ / සතර අගති)

{ලකුණු 2 යි}

(vii)

(අ) (දෙවු සොහොයුරා / නාරජු)

(ආ) (සත්තිගම්බ / තිත්තිර)

{ලකුණු 2 යි}

(viii) සිංහලයට නගන්න.

(අ) "එකඅත්ථපදං සෙය්‍යො - යං සුත්වා උපසම්මති"

යම් එක් පදයක් අසා කෙලෙස් සන්සිඳේ යි

(ආ) "සබ්බේ තසන්ති දණ්ඩස්ස - සබ්බේ භායන්ති මච්චුනො"

සියල්ලෝම දඬුවමට තැති ගනිති

සියල්ලෝම මරණයට බය වෙති

{ලකුණු 4 යි}

(ix) පහත සඳහන් අදහස් ඇති ධම්මපද ගාථා ලියන්න.

(අ) මේ ලෝකයේ වෛරයෙන් වෛරයෝ කිසි කලෙකත් නොසන්සිඳෙත්ම ය. ඒ වෛරයෝ අවෛරයෙන්ම සංසිඳෙති. මෙය හැමකල්හි නොවරදින සුලු (සනාතන) සත්‍ය ධර්මයකි.

"නහි වේරේන වේරානි
සම්මන්තීධ කුදාචනං
අවේරෙ න ච සම්මන්ති
ඒස ධම්මෝ සනන්තනෝ "

(ආ) භයින් තැති ගත් බොහෝ මිනිස්සු පර්වතයන් ද වන ද ආරාම ද චෛත්‍ය වෘක්ෂ ද පිහිට කොට සලකති.

" **බහුං වේ සරණං යන්ති**
පබ්බතානි වනානි ච
ආරාම රුක්ඛචේත්‍යානි
මනුසස භය තජ්ජිතා "

{ලකුණු 4 යි}

(x) "අ" කොටසෙ යෙදුමට ගැලපෙන යෙදුම "ආ" කොටසෙන් තෝරා හිස්තැන තුල ලියන්න.

"අ"		"ආ"
මාතුපෝසක	**සැමදා දෙමාපියන්ට සළකයි**	යතුන් මැරීම
වචීපරම	**වචනයෙන් පමණක් සැළකීම**	අසත්පුරුෂයන් ප්‍රියකිරීම
උභතොබ්‍යඤ්ජනක	**උපසම්පදා නොකරයි**	වැඩිහිටියන්ට ගරු කිරීම
පරාභවයකි	**අසත්පුරුෂයන් ප්‍රියකිරීම**	උපසම්පදා නොකරයි
කර්මක්ලේසයකි	**සතුන් මැරීම**	වචනයෙන් පමණක් සැළකීම
නිත්තිර ජාතකය	**වැඩිහිටියන්ට ගරු කිරීම**	සැමදා දෙමාපියන්ට සළකයි

{ලකුණු 6 යි}

II කොටස

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

02 (i) සරණාගමන පැවිද්ද යනු කුමක්දැයි පහදා දෙන්න.

මුල් කාලයේ බුදුරජාණන් වහන්සේට පමණක් සීමා වූ ඒහි භික්ෂු පැවිද්ද පසුව බුදුරජාණන් වහන්සේ විසින්ම සරණාගමන පැවිද්ද හඳුන්වා දී සරණාගමන පැවිද්ද නියම කරන ලදි. ඒ අනුව කෙස්, රැවුල, සිද කසාවත් අන්දවා උතුරු සළුව ඒකාංශ කොට රැස්ව සිටින භික්ෂූන්ට

Past Papers Wiki

සරණාගමන පැවිද්ද (ලෞ.)

වැන්දවිය යුතුය. ඉන්පසුව උකකුටියෙන් ඉදුවා දැත් බන්දවා මෙසේ කිවයුතු යැයි ඉගැන්විය යුතුය.

"බුද්ධං සරණං ගච්ඡාමි" ආදී ලෙස තිසරණය තෙවරක් කියවීම ය. මේ ක්‍රමයෙන් පැවිදි කිරීම සරණාගමන පැවිද්ද ලෙස හැදින්විය හැක.

බුද්ධ, ධම්ම සංඝ යන තුන්රුවන් සරණ යෑමෙන් ලබන පැවිද්ද (ලෞ.)

{ලකුණු 4 යි}

(ii) විනයෙහි සඳහන් පරිදි පැවිදි කිරීමට නුසුදුසු පුද්ගලයන් හයදෙනෙකු ලියන්න.

(විනයෙහි පැවිද්දට නුසුදුසු පුද්ගලයන් 39 ක් දැක්වේ)

- ✧ කපුටෙකු එළවිය නොහැකි වියෙහි ළදරුවා
- ✧ කුෂ්ඨ, ගෙඩි, වණ, ඇදුම, අපස්මාරය යන රෝගයන්ගෙන් පෙළෙන පුද්ගලයා
- ✧ අධිකරණයෙහි නම ලියවුනු පුද්ගලයා
- ✧ රාජභටයා
- ✧ අත් පා සිදුනු පුද්ගලයා
- ✧ දෙමාපියන්ගෙන් අවසර නොලැබූ අය
- ✧ කණ සහ නහය සිදුනු පුද්ගලයා

{එක් කරුණකට එක බැගින් ලකුණු 6 යි}

(iii) එම පුද්ගලයන් පැවිද්දට සුදුසු නොවන්නේ කවර හේතු නිසාදැයි පැහැදිලි කරන්න.

- ✧ යුධ කෝලහාල වලින් පසු පැරදුනු රාජභටයින් ජීවිතාරක්ෂාව පතා පැවිදි වූහ. මේ නිසා මෙවැනි අය පැවිදි නොකළ යුතු බව පෙන්වා දුන්හ.
- ✧ පංච ඉන්ද්‍රියන් විකළ අය මහණ බිමට ඇතුලත් වූ අතර එවැනි අය හට පැවිද්දෙහි උපරිම ඵල නෙලා ගත නොහැකි නිසා ඔවුන්ද තහනම් කරන ලදි.
- ✧ ජීවත්වීමේ මාර්ගයක් නැති ණය බරින් නිදහස් වීම පතා සමහරු පැවිද්ද ලබා ගත්හ. එවැනි අයද තහනම් කරන ලදි.
- ✧ බුදුරජාණන් වහන්සේ තම පියාණන් විසින් ප්‍රකාශ කරන ලද " දෙමාපිය අවසරයක් නොමැතිව මහණ නොකිරීම සිදු කළ යුතුය " යන මහජන මතයට ගරු කිරීමටක් වශයෙන් එවැනි අය මහණ කිරීමද තහනම් කරන ලදි.

✧ එමෙන්ම ආනන්තරීය පාපකර්ම සිදු කළ අයද මහණ බිමට ඇතුළත් වූ හෙයින් ඒ අයටද පැවිදි උපසම්පදාව සිදු නොකළ යුතුය යන්න දේශනා කළහ.
(නම්කොට ඇති පුද්ගලයන් නුසුදුසු වීමට හේතු දක්වා තිබිය යුතුය)

{ලකුණු 8 යි}

03 (i) ධම්මික සුත්‍රයෙහි සඳහන් ගිහි ප්‍රතිපදාවට අයත් ශික්ෂණ හතරක් ලියන්න.

✧ ප්‍රාණඝාතයෙන් වැළකීම
✧ අදින්නාදානයෙන් වැළකීම
✧ කාමයෙහි වරදවා නොහැසිරීම
✧ මුසාවාදයෙන් වැළකීම
✧ මද්‍යපානයෙන් වැළකීම

{ලකුණු 4 යි}

(ii) අලසකමේ දෝස හය සිගාලෝවාද සුත්‍රයෙහි එන ආකාරයෙන් දක්වන්න.

✧ ඉතා ශීත යැයි වැඩ නොකරයි
✧ ඉතා උෂ්ණ යැයි වැඩ නොකරයි
✧ ඉතා සවස් යැයි වැඩ නොකරයි
✧ ඉතා උදෑසන යැයි වැඩ නොකරයි
✧ ඉතා බඩගිනි යැයි වැඩ නොකරයි
✧ ඉතා බඩ පිරී ඇතැයි වැඩ නොකරයි

{ලකුණු 6 යි}

(iii) අලසකම වස්තු විනාශයට කෙසේ හේතු වන්නේ දැයි විස්තර කරන්න.

ඉහතින් දැක්වූ අලසකමේ දෝස හයක් ඇතිව යම්කිසි පුද්ගලයෙකු තම ලෞකික ජීවිතය සකසා ගනී නම් ඔහු හට අලුතින් උපදින ධනයක් නැත්තේය. තමා ළඟ තිබෙන්නා වූ ධනය දිනෙන් දින භාවිතයට ගැනීමෙන් එයද නැති වී යයි. මෙසේ අලුතින් ධනය නූපදීමට කටයුතු කරමින් පුද්ගලයා තම ජීවිතය සකසා ගතහොත් අලසකමින් ජීවත් වීමට පුරුදු වුවහොත් ධනය විනාශයට පත් වේ.

ඉහත කරුණු ගෙන හැර දක්වමින් පිළිතුරු ඉදිරිපත් කරයිනම් කරුණු සලකා බලා ලකුණු ප්‍රදානය කරන්න.

{ලකුණු 8 යි}

04 (i) දීඝජාණු කෝලිය පුත්‍රයා බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ කළ ඉල්ලීම ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දැක්වෙන ලෙස ලියන්න.

" මයං භන්තෙ ගිහි කාමභෝගි පුත්තසම්බාධසයනං අජ්ඣාවසාම, කසිකවත්ථනං පච්චනුභොම, මාලාගන්ධ විලෙපනං ධාරයාම, ජාතරූපරජතං සාදියාම, තෙසංනො භන්තෙ භගවා අම්හාකං, තථා ධම්මං දෙසතු. යේ අම්හාකං අස්සු ධම්මා දිට්ඨධම්මහිතාය දිට්ඨධම්මසුඛාය සම්පරාය සුඛායති. "

" ස්වාමිනි, අපි ගිහිව පස්කම් සැප අනුභව කරමින් අඹු දරුවන්ගේ පීඩා සහිතව වාසය කරමු. කසීරට උපන් සුවද සඳුන් පරිභෝග කරමු. මල් ගද විලෙවුන් දරමු. රන් රිදී මසුකහවනු ඉවසමු. ස්වාමිනි භාග්‍යවතුන් වහන්සේ ඒ අපට මෙලොව හිත සුව පිණිස, පරලොව හිත සුව පිණිස උපකාරී වන ධර්මයක් දේශනා කරන සේක්වා "

{ලකුණු 4 යි}

(ii) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි සදහන් මෙලොව හිතසුව පිණිස හේතුවන කරුණු පෙන්වා දී කෙටියෙන් විස්තර කරන්න.

- ✧ උට්ඨාන සම්පදාව
- ✧ ආරකඛ සම්පදාව
- ✧ කල්‍යාණ මිත්‍රතාව
- ✧ සමජීවිකතාව

උට්ඨාන සම්පදාව - යම් කුල පුත්‍රයෙක් යම් කර්මාන්තයකින් (සීසැමෙන්, වෙළඳාමෙන්, ගව පාලනයෙන්, ධනුශිල්පයෙන් රාජ්‍ය සේවයෙන් හෝ වෙනත් ශිල්පයකින්) දිවි පවත්වයි නම් එහි දක්ෂ වේද, අනලස් වේද, විමංසන බුද්ධියෙන්, කර්මාන්ත කරවීමට හැකියාවක් වෙයිද එය උට්ඨාන සම්පදාව වේ.

ආරකඛා සම්පදාව - උත්සාහයෙන්, බාහුබලයෙන්, උපයාගත් ධනය සොරුන්ගෙන්, රජුගෙන්, ගින්නේ, සැඩ පහරින් ආරක්ෂා කර ගැනීම.

කල්‍යාණ මිත්‍රතාව - යම් ගෘහපති පුත්‍රයෙක් ශ්‍රද්ධාසම්පන්න, ශීලසම්පන්න, ත්‍යාගසම්පන්න, ප්‍රඥාසම්පන්න, අය සමග එක්ව වාසය කරයි නම් සාකච්ඡා කරයි නම් එය කල්‍යාණ මිත්‍රතාවයි.

සමජීවිකතාව - යම් කුල පුත්‍රයෙක් භෝගයන්ගේ අය-වැය දැන අයවැය සමව පවත්වාගෙන යාමය.

(ලකුණු 6 යි)

(iii) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දැක්වෙන " සද්ධා සම්පදාව " පරලොව දියුණුවට කෙසේ හේතුවන්නේ දැයි පහදන්න.

මේ ලොව වාසය කරන කුල පුත්‍රයෙක් බුදුරජාණන් වහන්සේ කෙරේ විශ්වාසයකින් ශ්‍රද්ධා ඇත්තේ වෙයි. තථාගතයන් වහන්සේගේ බුද්ධත්වය විශ්වාස කරයි. ඒ භාග්‍යවතුන් වහන්සේ, සියලු ක්ලේශයන්ගෙන් දුරු වූ හෙයින්ද, සංසාර චක්‍රය සිඳලූ හෙයින්ද, රහසින්වත් පව් නොකරන හෙයින්ද, සියලු පූජාවන්ට සුදුසු වන හෙයින්ද අරහත් ය, චතුරාර්ය සත්‍යය තම නැණින් අවබෝධ කළ හෙයින් සම්‍යක්සම්බුද්ධ ය, විද්‍යාචරණ සම්පන්න ය, සුගත ය, ලෝක විදූ ය, අනුත්තර පුරිස දම්ම සාරථී නම් වන සේක. දෙවි මිනිසුන් හට ශ්‍රේෂ්ඨ වන හෙයින් ශාස්තෘ වන සේක. දත යුතු සියල්ල දන්නා හෙයින් බුද්ධ ය. භාග්‍ය ඇති හෙයින් භාග්‍යවත්යහ. ව්‍යග්ඝපජ්ජය මේ " සද්ධා සම්පදාව " යැයි කියනු ලැබේ. බුදුරජාණන් වහන්සේගේ නව අරහාදී බුදුගුණයන් තේරුම්ගෙන උන්වහන්සේ කෙරේ ශ්‍රද්ධාවෙන් කටයුතු කිරීම මගින් පරලොව දියුණුව ඇතිවන අයුරු විස්තර කොට ඇත්නම් ප්‍රමාණවත් ලකුණු ප්‍රදානය කරන්න.

(ලකුණු 08 යි)

05 (i) සිංහලයට නගන්න.

(අ) අථ ඛො ධම්මිකෝ උපාසකො පඤ්චහි උපාසක සතෙහි සද්ධිං යෙන භගවා තෙනුපසංකම්.

ඉක්බිති ධම්මික උපාසක තෙම පන්සීයක් උපාසකයන් සමග භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය.

(ආ) වන්දාමි චේතියං සබ්බං - සබ්බඨානේසු පතිට්ඨිතං

සෑම තැනම පිහිටියා වූ සියලු චෛත්‍යයන් වන්දනා කරමි

(ඉ) සො එවං අත්තනො සබ්බං ධනං විසජ්ජෙත්වා දානං අදාසි

ඔහුතෙම මෙසේ තමන්ගේ සියලු ධනය වියදම් කොට දන් දුන්නෙහිය.

(ඊ) අතීතෙ ජම්බුදීපේ අමරවතී නාම නගරං අහොසි. තස්ථ සුමේධො නාම එකො බ්‍රාහ්මණ කුමාරො විහරති

අතීතයෙහි දඹදිව අමරවතී නම් නගරයක් විය. එහි සුමේධ නම් එක් බමුණු කුමාරයෙක් වාසය කරයි.

{ලකුණු 8 යි}

(ii) මෙම වාක්‍ය පාළියට නගන්න.

(අ) මෙම දානය අපි භික්ෂු සංඝයාට දෙමු

ඉමං භිකඛං මයං භික්ඛු සංඝසස දේම

(ආ) සියලු සත්ත්වයෝ මිය යන්නාහ

සබ්බේ සත්තා මරිස්සන්ති

(ඉ) පිදිය යුතු අය පිදීම - උතුම් මංගල කරුණකි

පූජාච පූජනීයානං - ඒතං මංගල මුත්තමං

(ඊ) අපි විහාරයට ගොස් බුදුරජාණන් වහන්සේ බලමු

මයං විහාරං ගන්ත්වා බුද්ධං පස්සාම

(උ) අතීතෙහි බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජතුමා රාජ්‍ය කළේය

අතීතේ බාරාණසීයං නගරේ බ්‍රහ්මදත්ත රාජා රජ්ජං ආකාසි

{ලකුණු 10 යි}

06 (i) මෙම පාඨය සිංහලයට නගන්න.

" බෝධිසත්තො කපිගණං අදාය තස්ථ ඵලානි ඛාදන්තො එකසමිං කාලෙ ඉමස්ස උදකෙ පතිත ඵලං නිස්සාය අම්හාකං භයං උප්පජ්ජිස්සති ති උදකමත්ථකෙ සාඛාය එකං ඵල්මපි අනවසෙසෙත්වා පුප්ඵකාලෙ කළායමත්ත කාලතො පට්ඨාය ඛාදාපේති "

" බෝසත් තෙම වඳුරු සමූහයා එක්කරගෙන ගොස් එහි ගෙඩි කන්නේ එක් කලෙක දියෙහි වැටුනු ගෙඩියක් නිසා අපට බියක් ඇතිවන්නේය. (දැන්) දියමත ඇති අත්තෙහි එක ගෙඩියක්වත් ඉතිරි නොකොට මල් කාලයේ - තුරු මුදු ඇට පමණ කාලයේ පටන් කවයි. "

{ලකුණු 8 යි}

(ii) මහා කපි ජාතකයෙ හි දැක්වෙන වඳුරු රජුගේ චරිතය තුලින් පාලකයෙකු තුල පැවතිය යුතු විශිෂ්ඨ ගුණාංග තුනක් පහදා දෙන්න.

01. සිය දිවි නොතකා පිරිසේ යහපතට ක්‍රියා කිරීම
02. සෝකයට හා බියට පත් තමාගේ පිරිස රැක ගැනීම
03. දුර දක්නා නුවණ
04. කම මෘත ශරීරයට පවා ගෞරව ලැබීමට සුදුසු ලෙස ක්‍රියා කිරීම
05. මනා පවුරුෂයකින් යුක්තවීම

ඉහත කරුණු තුනක් විස්තර කර තිබීම. {ලකුණු 10 යි}

07 (i) මෙම පාඨය සිංහලයට නගන්න

" කොනුඛො භිකඛවේ අග්ගාසනං අග්ගෝදකං අග්ගපිණ්ඩං අහරන් තීති ? එකච්චේ ඛත්තිය කුල, පබ්බ්පිතො ආහංසු. එකච්චේ බ්‍රහ්මණකුලා ගහපති කුලා පබ්බ්පිතෝති, අපරෙ විනයධරො ධම්මකථිකො පඨමසස ඣානසස ලාභි, දුතියසස, තතියසස, චතුතථසස, ඣානසස ලාභීති, අපරෙ සොතාපන්නො සකදාගාමී අනාගාමී අරහා තෙවිජ්ජො ජළාභිඤ්ඤො ති ආහංසු "

" මහණෙනි මුල්ම අසුන්, මුල්ම පැන්, මුල්ම ආහාර ලැබීමට සුදුස්සා කවරෙක්ද ? ඇතැමෙක් ක්ෂත්‍රිය කුලයෙන් පැවිදි වූවෙකැයි කීහ. ඇතැමෙක් බ්‍රාහ්මණ හා ගෘහපති කුලයෙන් පැවිදි වූවෙකැයි කීහ." තවකෙක් විනයධරයාය. ධම්මකථිකයාය. පළමු ධ්‍යානය ලැබූ අයය. දෙවැනි, තෙවැනි, සිව්වැනි ධ්‍යානලාභියා යැයි කීය. තවත් අයෙක් සෝතාපත්ත සකදාගාමී අනාගාමී අරහත් ත්‍රිවිද්‍යාලාභී ෂට් අභිඥාලාභි යයි පිළිවෙලින් කීහ.

{ලකුණු 8 යි}

(ii) බුද්ධ ශාසනයෙ හි වැඩිමහලු පිළිවෙල ක්‍රියාත්මක වන ආකාරය තිත්තිර ජාතකය ඇසුරින් විස්තර කරන්න.

බුදුන් දවස සාරිපුත්ත හිමියන්ට සෙනසුන් අහිමි වීම සම්බන්ධයෙන් " මා ජීවත්ව සිටියදීම භික්ෂූහු ඔවුනොවුන්ට ගරු සරු නොදක්වති " යනුවෙන් සවග මහණහු ඉදිරිපිටට ගොස් දොස් පවරා මුල්ම අසුන්, මුල්ම පැන්, මුල්ම ආහාර ලැබීමට සුදුස්සා කවරෙක්ද ? යැයි විචාරය.

Past Papers Wiki

" මහණෙනි මාගේ සසුනෙහි මුල්ම අසුන ආදිය සඳහා ක්ෂත්‍රීය කුලයෙන් පැවිදි වූ අයෙකු විම ප්‍රමාණවත් නොවේ. විනයධර සූත්තන්තික අභිධම්මික හෝ ප්‍රථමධ්‍යාන ආදිය ලැබීම සෝවාන් ආදි මගඵල ලැබීම හෝ ප්‍රමාණවත් නොවේ."

" මහණෙනි මේ සසුනෙහි වැඩිමහළු පිළිවෙල අනුව වැඳීම, ඉදිරියෙහි නැගී සිටීම, ඇදිලි බැඳීම නිවැරදිව ගෞරව දැක්වීම කළ යුතුය යනුවෙන් තිරිසන් සතුන් පවා වැඩිමහල්ලා තෝරා ගරු සරු දැක්වූ බව තිත්තිර ජාතකය දේශනා කරමින් පෙන්වා දුන් සේක .

ජාතක කථාවේ තොරතුරු ඇසුරින් ලියා ඇති පිළිතුරට ප්‍රමාණවත් ලකුණු ප්‍රදානය කරන්න.

{ලකුණු 10 යි}

****

PAST PAPERS WIKI

91/2/4/11/2018/02/S/ADCH/08

රහස්‍යයි

ඇගයීම් ශාලාවෙන් පිටතට රැගෙනයාම තහනම්

ශ්‍රී ලංකා
විභාග දෙපාර්තමේන්තුව



Curriculum
Assessment
&
Evaluation
Teaching
Learning
N E T S

ලකුණු දීමේ පටිපාටිය

බෞද්ධ ධර්මාචාර්ය විභාගය 2017 (2018)

(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය.

සංකේත අංකය

ඇගයීම් (ආයතනික විභාග) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි. ප්‍රධාන පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

සියළුම හිමිකම් ඇවිරිණි.

33157

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2562 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2017 (2018)

S 2

(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය

පැ තුනයි

I කොටසේ ප්‍රශ්නය ද, **II** වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

සැ.යු. **I** කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලියා, **II** කොටසේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාරදෙන්න.

විභාග අංකය : ..

ටී. ඩී. විදානපතිරණ
නියෝජ්‍ය විභාග කොමසාරිස් (රහස්‍ය ආ/වි)
ජාතික අධ්‍යාපන පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
තැ.පෙ. 1503, කොළඹ

I කොටස

1. (i) සිට (vii) තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(i) (අ) බුද්ධෝත්පත්ති සමයෙහි සිටි බොහොමයක් ශ්‍රමණ පිරිස් (ආත්මාර්ථ සාධනය/පරාර්ථ සාධනය) කෙරෙහි වඩාත් උනන්දු වූහ.

(ආ) පස්වග තවුසන් ඇතුළු බොහෝ පැවිද්දන් දැඩිව විශ්වාස කළේ (අත්තකිලමථානු යෝගය/මධ්‍යම ප්‍රතිපදාව) මගින් විමුක්තිය ලැබිය හැකි බවයි.

(ලකුණු 02 යි)

(ii) (අ) භික්ෂූන් සිවුපසය පරිභෝග කළ යුතු වන්නේ (ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන්/දායකයන්ට පින් දීමෙන්) පසුව බව බුද්ධ දේශනාවේ සඳහන් වේ.

(ආ) දැහැමිව උපයාගත් ධනයෙන් ලෞකික ජීවිතය ධාර්මිකව ගත කරන (භික්ෂුව/උපාසකයා) මරණින් පසුව සුගතිගාමී වන බව ධර්මයෙහි දැක්වේ.

(ලකුණු 02 යි)

(iii) (අ) සිගාලෝවාද සූත්‍රයෙහි සදිසා නමස්කාරයට අනුව මහණ බමුණන් (උඩ දිසාව/නැගෙනහිර දිසාව) නියෝජනය කරන බව සඳහන් වේ.

(ආ) තමාට සංග්‍රහ කරන කුලපුත්‍රයාට මහණ බමුණන් (පැවිද්ද ලබා දීමෙන්/නො ඇසූ ධර්මය කියා දීමෙන්) අනුකම්පා කළ යුතු බව සිගාලෝවාද සූත්‍රයෙහි උගන්වා ඇත.

(ලකුණු 02 යි)

(iv) (අ) ගුණ දහමෙන් තමන්ට වැඩි හෝ තමන්ට සමාන මිතුරෙකු ඇසුරට නොවේ නම් (ඥානවන්තයකු සමග/හුදෙකලාව) විසීම යෝග්‍ය බව ධම්මපදයෙහි දැක්වේ.

(ආ) ක්ෂත්‍රිය වංශයෙහි උපතත්, බුදුරජාණන් වහන්සේගේ ඥාතිත්වයත් (ථුල්ලතිස්ස/නන්ද) තෙරුන්ගේ උඩඟුකමට හේතු වූ බව ධම්මපද නිදාන කථාවක සඳහන් වේ.

(ලකුණු 02 යි)

(v) (අ) 'තාදි ගුණය' යනු (කෙලෙසුන් තැවීමයි./අටලෝ දහමෙහි කම්පා නොවීමයි.)

(ආ) දානය දසමහා කුසල්වලට (අයත් වන/අයත් නොවන) පින්කමකි.

(ලකුණු 02 යි)

(vi) (අ) ප්‍රාණඝාතය ආදී පස් පවෙන් වැළකී ජීවත්වන තැනැත්තා (ගුණවතෙකි./සිල්වතෙකි.)

(ආ) 'අසෙවනා ච බාලානං' යන පාලි පාඨයෙන් අදහස් වන්නේ (බාලයන් ඇසුරු නොකළ යුතු/පණ්ඩිතයන් ඇසුරු කළ යුතු) බව ය.

(ලකුණු 02 යි)

[2 වැනි පිටුව බලන්න.

(vii) (අ) බුදුරජාණන් වහන්සේ ජේතවනයෙහි වසන කල්හි මව පෝෂණය කරන භික්ෂුවක අරබයා (සාලිකේදාර/මණිකණ්ඨ) ජාතකය දේශනා කළ සේක.

(ආ) සැබෑ නායකයකු තුළ තිබිය යුතු ගුණාංග මනාව ප්‍රකට වන්නේ (තිත්තිර/මහාකපි) ජාතක කථාවෙනි.

(ලකුණු 02 යි)

(viii) සිංහලට නගන්න.

(අ) අත්තනො'ව අවෙක්ඛෙය්‍ය - කතානි අකතානි ච

.....

.....

(ආ) උදකංහි නයන්ති නෙත්තිකා - උසුකාරා නමයන්ති තෙජනං

.....

.....

(ලකුණු 04 යි)

(ix) පහත සඳහන් අදහස් ඇති ධම්මපද ගාථා ලියන්න.

(අ) සොරෙක් සොරෙකුට යම් නපුරක් කෙරේ ද, එසේ ම වෛර ඇති කෙනෙක් වෛරී පුද්ගලයකුට යම් නපුරක් කෙරේ ද, ඊටත් වඩා නපුරක් වරදවා තබන ලද සිත ඔහුට කරන්නේ ය.

.....

.....

.....

.....

(ආ) දැඩි ලෙස ඝන වූ පර්වතය සුළඟින් නොසැලෙන්නේ යම් සේ ද, එමෙන් නුවණැත්තෝ නින්දා ප්‍රශංසාවන්හි කම්පා නොවෙති.

.....

.....

.....

.....

(ලකුණු 04 යි)

(x) 'අ' කොටසේ යෙදුමට සම්බන්ධතාවක් දක්වන ඒවා 'ආ' කොටසෙන් තෝරා, තිත් ඉර මත ලියන්න.

'අ'		'ආ'
අධික තෘෂ්ණාව	.....	අයට වඩා වැය
උදුම්බරබාදික	.....	අධිකරණ සමථ
ගැටුම් නිරාකරණය	.....	කොසිය සිටු
පහත් චරිත ලක්ෂණ	.....	ධම්මික සූත්‍රය
පොහොයවත	.....	ප්‍රාතිමෝක්ෂය
භික්ෂු විනය	.....	වසල සූත්‍රය

(ලකුණු 06 යි)

* *

[3 වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2562 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2017 (2018)

S 2

(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

2. (i) මෙට ශාස්තෘවරුන් අතුරින් ආත්මවාදය හෝ නාස්තික දෘෂ්ටිය නියෝජනය කළ ශාස්තෘවරුන් **හතරදෙනෙකු** නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) යසකුල පුත්‍රයාගේ පැවිද්ද පිළිබඳව කෙටියෙන් ලියන්න. *(ලකුණු 06 යි)*

(iii) විනයෙහි දැක්වෙන පැවිදි නොකළ යුතු පුද්ගලයන් අතුරින් **සිව් දෙනෙකු** දක්වා, ඔවුන් පැවිද්දට සුදුසු නොවන්නේ කවර හේතු නිසා දැයි පහදා දෙන්න. *(ලකුණු 08 යි)*

3. (i) සිගාලෝවාද සූත්‍රයට අනුව කුලපුත්‍රයකු විසින් මහණ බමුණන්ට උපස්ථාන කළ යුතු ආකාර **හතරක්** ලියා දක්වන්න. *(ලකුණු 04 යි)*

(ii) කුලපුත්‍රයකු විසින් මහණ බමුණන් උදෙසා තම යුතුකම් ඉටු කළ විට ශාසනයේ පැවැත්ම තහවුරු වන ආකාරය දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) දැහැමි සමාජයක් ගොඩනැගීම සඳහා ගිහි පැවිදි සම්බන්ධය ඉවහල් වන ආකාරය පෙන්වා දෙන්න. *(ලකුණු 08 යි)*

4. (i) චන්ද්‍ර මාස ක්‍රමය අනුව ලැබෙන උපොසථ දින **හතර** නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) උපොසථය සඳහා සංඝයා රැස්වීමට පෙර සිදු කළ යුතු 'පුබ්බකරණය' පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) පොහොය කර්මය තුළින් භික්ෂූන් අතර සමගිය හා පාරිශුද්ධිය ඇති වන අයුරු පහදා දෙන්න. *(ලකුණු 08 යි)*

5. (i) **සිංහලට** නගන්න.

(අ) උපාසකො චීවරං අදාය බුද්ධං පූජෙති.

(ආ) තුම්හෙ බුද්ධස්ස ධම්මං සුනාථ.

(ඉ) දුට්ඨගාමිණී මහාරාජා ලංකාදීපං පාලයි.

(ඊ) පිතා පුත්තෙන සද්ධිං නගරං ගච්ඡති. *(ලකුණු 08 යි)*

(ii) මෙම වාක්‍ය **පාලියට** නගන්න.

(අ) දායකයා භික්ෂු සංඝයාට දන් දෙයි.

(ආ) භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ පා වැන්දාහ.

(ඉ) සුදුසු කාලයෙහි වැසි වසීවා!

(ඊ) අපි මව්පියන් සමඟ බුදුන් වඳින්නෙමු.

(උ) භික්ෂුව ගමට ගොස් දහම් දෙසයි. *(ලකුණු 10 යි)*

6. (i) මෙම පාඨය **සිංහලට** නගන්න.

අතීතෙ බාරාණසියං බ්‍රහ්මදත්තෙ රජ්ජං කාරෙන්තෙ බොධිසත්තො හිමවන්තප්පදෙසෙ හත්ථියොනියං නිබ්බත්තිත්වා සබ්බසෙතො අහොසි, අභිරුපො. අසීති හත්ථිසහස්ස පරිවාරො. මාතා පන'ස්ස අන්ධා. සො මධුරමධුරානි එලාඵලානි හත්ථිනං දත්වා මාතුසන්තිකං පෙසෙති. *(ලකුණු 08 යි)*

(ii) මව්පිය උපස්ථානය පිළිබඳව මාතුපෝසක ජාතක කථාවෙන් ලබා දෙන ආදර්ශය අගය කරන්න. *(ලකුණු 10 යි)*

7. (i) මෙම පාඨය **සිංහලට** නගන්න.

අථෙකදිවසං මණිකණ්ඨො නාම නාගරාජා භවනා නික්ඛමිත්වා ගඛගාසීරෙ මාණවක වෙසෙන විචරන්තො කණ්ටිඨස්ස අස්සමං ගන්ත්වා එකමන්තං නිසීදි. තෙ අඤ්ඤමඤ්ඤං සම්මොදනකථං කත්වා විස්සාසිකා අහෙසුං. *(ලකුණු 08 යි)*

(ii) මණිකණ්ඨ ජාතකයෙහි සඳහන් වන නාරජුගේ හා තවුසාගේ කථා ප්‍රවෘත්තිය ඇසුරෙන් ඔහේ ස්වභාවය පහදා දෙන්න. *(ලකුණු 10 යි)*

* * *

PAST PAPERS WIKI

(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය.

I කොටස සඳහා ලකුණු	-	28
II කොටස සඳහා ලකුණු	-	72 (18×4)
ලකුණු එකතුව	-	100

I කොටසේ

i, ii, iii, iv, v, vi, vii ප්‍රශ්න සඳහා ලකුණු 2 බැගින්	14 යි.
viii, ix ප්‍රශ්න සඳහා ලකුණු 4 බැගින්	08 යි.
x ප්‍රශ්නය සඳහා ලකුණු	06 යි.
	28 යි.

II කොටසේ ප්‍රශ්න අතුරින් තෝරාගත් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයීම අවශ්‍යය. 2, 3, සහ 4 වන ප්‍රශ්න කොටස් 03කින් යුක්ත වේ.

i කොටසට ලකුණු 04 බැගින් ද,

ii කොටසට ලකුණු 06 බැගින් ද,

iii කොටසට ලකුණු 08 බැගින් ද, හිමි වේ.

5, 6 සහ 7 වන ප්‍රශ්න කොටස් 2කින් යුක්ත වේ.

i කොටසට ලකුණු 08 බැගින් ද,

ii කොටසට ලකුණු 10 බැගින් ද, හිමි වේ.

මේ අනුව එක් ප්‍රශ්නයකට ලකුණු 18 බැගින් ප්‍රශ්න 04 ට **ලකුණු 72ක්** හිමි වේ.

I කොටස.

01.

i. (අ) ආත්මාර්ථ සාධනය / පරාර්ථ සාධනය
(ආ) අත්තකිලමථානුයෝගය / මධ්‍යම ප්‍රතිපදාව

(ලකුණු 02යි.)

ii. (අ) ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන් / දායකයන්ට පින් දීමෙන්
(ආ) භික්ෂුව / උපාසකයා

(ලකුණු 02යි.)

iii. (අ) උඩ දිශාව / නැගෙනහිර
(ආ) පැවිද්ද ලබාදීමෙන් / නො ඇසූ ධර්මය කියාදීමෙන්

(ලකුණු 02යි.)

iv. (අ) අඥානයෙකු සමඟ / හුදෙකලාව
(ආ) ථුල්ලතිස්ස / නන්ද

(ලකුණු 02යි.)

v. (අ) කෙලෙසුන් නැතිවීමයි / අට ලෝ දහමෙහි කම්පා නොවීමයි.
(ආ) අයත් වන / අයත් නොවන

(ලකුණු 02යි.)

vi. (අ) ගුණවතෙකි / සිල්වතෙකි.
(ආ) බාලයන් ඇසුරු නොකළ යුතු / පණ්ඩිතයන් ඇසුරු කළ යුතු

(ලකුණු 02යි.)

vii. (අ) සාලිකේදාර ජාතකය / මණිකණ්ඨ ජාතකය
(ආ) තිත්තිර ජාතකය / මහාකපි ජාතකය

(ලකුණු 02යි.)

viii. (අ) තමා කළ දේ ද නොකළ දේ ද විමසා බැලිය යුතුය.
(ආ) දියාලුවෝ දිය ගෙනයති. හී වඩුවෝ හී දඬු නමති.

(ලකුණු 04යි.)

ix. (අ) දිසෝ දිසං යං තං කයිරා - වෙරී වා පන වෙරිනං
මිච්ඡා පණිහිතං චිත්තං - පාපියෝ නං තතෝ කරෙ.
(ආ) සෙලෝ යථා එකඝනෝ - වාතෙන න න සම්‍රීරති
එවං නින්දාපසංසාසු - න සම්ඤ්ජන්ති පණ්ඩිතා.

(2+2 = ලකුණු 04යි.)

x.

(අ)		(ආ)
අධික තෘෂ්ණාව	-	කොසිය සිටු
උදුම්බරබාදක	-	අයට වඩා වැය
ගැටුම් නිරාකරණය	-	අධිකරණ සමථ
පහත් චරිත ලක්ෂණ	-	වසල සූත්‍රය
පොහොයවත	-	ධම්මික සූත්‍රය
භික්ෂු විනය	-	ප්‍රාතිමෝක්ෂය

(ලකුණු 06යි.)

II කොටස.

02.

i. • පූර්ණ කස්සප • පකුධකච්චායන
• අජිත කේසකම්බලි • සඤ්ජය බෙල්ලට්ඨිපුත්ත

(එක් නිවරදි පිළිතුරකට එක ලකුණ බැගින් දෙන්න.)

ii. බරණැස් නුවර යසකුලපුත් කම්සැප කෙරෙහි කළකිරී සසරින් එතෙරවීමට සිතා මැදියම රාත්‍රියෙහි ගෙයින් නික්ම බරණැස ඉසිපතනාරාමයට ගියේය. බුදුරජාණන් වහන්සේ යස කුලපුත්‍රයා තුළ පළමුව ශ්‍රද්ධාව ඇතිකොට දහම් දෙසූ සේක. ධර්මය ඇසූ ඔහු ඇතිවන සියල්ල නැතිවන බව අවබෝධ කර ගත්තේය. පසුදින උදෑසන පුතා සොයමින් ඉසිපතනාරාමයට පැමිණි පියාට බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කරද්දි එය ඇසූ යස කුලපුත් රහත්බව ලබාගත් අතර පසුව 'ඒහි භික්ඛු' මහණ උපසම්පදාව ලබා ගත්තේය.

(මෙම කරුණු ඇතුලත් පිළිතුරට ලකුණු 06ක් දෙන්න.
ගේඛන දෝෂ ඇත්නම් සුදුසු පරිදි ලකුණු අඩු කරන්න.

iii.

(1) කපුටකු වළඳිය හොඟක් එයෙහි ඉදුරුවා.

(2) කුෂ්ඨ, ගෙඩි, වණ, ඇදුම. අපස්මාර රෝගවලින් පෙළෙන පුද්ගලයා.

(3) රාජ භටයා.

(4) ප්‍රසිද්ධ හොරා.

(5) සිරෙන් පැනගිය අපරාධකරු

(6) අධිකරණ නම ලියැවුණු අපරාධකරු

(7) වරදට කසයෙන් තළනු ලැබූ පුද්ගලයා

(8) සිරුරෙහි සලකුණු තබා දඬුවම් කරනු ලැබූ අය

(9) ණයකරු

(10) දාසයා

(11) දෙමව්පියන්ගෙන් අවසර නොලැබූ අය.

(12) අතක් සිඳුණු පුද්ගලයා.

(13) පයක් සිඳුණු පුද්ගලයා

(14) අත් පා සිඳුණු පුද්ගලයා.

(15) කණ සිඳුණු පුද්ගලයා.

(16) නැහැය සිඳුණු පුද්ගලයා.

(17) කණ හා නැහැය සිඳුණු පුද්ගලයා.

(18) ඇඟිලි අග සිඳුණු පුද්ගලයා.

(19) ඇඟිලි සිඳුණු පුද්ගලයා.

(20) මහ නහර සිඳුණු පුද්ගලයා.

(21) ඇඟිලි එකිනෙක බැඳී ඇති පුද්ගලයා.

(22) කුදු තැනැත්තා.

(23) මිටි තැනැත්තා.

(24) බෙල්ලෙහි ගෙඩි ඇති පුද්ගලයා.

(25) බරවා පා ඇත්තා.

(26) පාප රෝග ඇත්තා.

(27) පිරිස් මැද කැපී පෙනෙන විරූපි පුද්ගලයා

(28) එක් ඇසක් කණා වූ පුද්ගලයා

(29) අත් පා වක් වූ පුද්ගලයා.

(30) කොරා

(31) සිරුරෙන් අඩක් පණ නැති පුද්ගලයා.

(32) පීළා

(33) ජරා දුර්වල පුද්ගලයා.

(34) අන්ධයා

(35) ගොළුවා

(36) බිහිරා

(37) අඳ - බිහිරි පුද්ගලයා

(38) ගොළු - බිහිරි පුද්ගලයා

(39) අඳ - ගොළු - බිහිරි පුද්ගලයා

ඉහත කී පුද්ගලයින් තතර දෙනෙකු ඇසුරෙන් පිළිතුර සපයා ඇත්නම් එක් ලකුණ බැගින් සලකා ලකුණු 08ක් දෙන්න.

(මුළු ලකුණු 18යි.)

03.

i.
- මෛත්‍රී සහගත කාය කර්මයෙන්
- මෛත්‍රී සහගත වාක් කර්මයෙන්
- මෛත්‍රී සහගත මනො කර්මයෙන්
- මහණ බමුණන් සඳහා ගේදොර විවෘතව තැබීමෙන්
- ආහාරපාන ආදිය පිළිගැන්වීමෙන්

(මෙම කරුණු පහෙන් තතරක් ලියා ඇත්නම් ලකුණු 04ක් ලබා දෙන්න.)

ii. පැවිද්දන් වනාහි ආත්ම විමුක්තිය සඳහා ක්‍රියාකරමින් ගිහිපිරිසට ධර්මය කියාදෙන පිරිසකි. ඔවුහු ධනෝපායන කර්මාන්තවල නොයෙදෙන අතරම දායකයන්ගෙන් යැපෙති. තමන්ගේ දෙලොව දියුණුවට මග කියාදෙන පැවිදි පිරිසට කයින්, වචනයෙන් පමණක් නොව සිතින්ද මෛත්‍රීය දක්වන දායකයෝ උන්වහන්සේලාට තම නිවස නිරන්තරයෙන්ම විවෘතව තබමින් නිසි ගෞරවය හා පිළිගැනීම ලබාදෙති. මේ නිසා පැවිදි පිරිස සම්බාධක රහිතව පහසුවෙන් ජීවත්වෙති. සසුනට ඇලෙති. බණ භාවනාදියෙහි නිරත වීමෙන් තමන්ද අධ්‍යාත්මික වශයෙන් දියුණු වෙමින් අනුන්ගේ ද යහපත සලසාලති. මේ හේතුවෙන් සම්බුද්ධ ශාසනයේ පැවැත්ම තහවුරු වේ. මේ ආදි කරුණු දක්වමින් කුලපුත්‍රයෙකු විසින් පැවිද්දාට යුතුකම් ඉටුකිරීම නිසා ශාසනයේ පැවැත්ම තහවුරු වන අයුරු දක්වමින් ලියා ඇති අර්ථවත් හා ප්‍රමාණවත් පිළිතුරකට **<u>ලකුණු 06ක්</u>** ලබා දෙන්න.

iii. ගිහිපිරිස පැවිද්දන් කෙරෙහි මෛත්‍රී සහගතව ක්‍රියාකරමින් ද නිසි ගෞරවය හා පිළිගැනීම ලබාදෙමින් ද ක්‍රියාකරන විට පැවිදි පිරිස දායකයන් වෙත බලවත් කරුණාවෙන් තම යුතුකම් ඉටුකරති. ගිහි පැවිදි දෙපිරිසම යුතුකම් ඉටුකරමින් වගකීමෙන් ක්‍රියාකිරීම නිසා පැවිදි ගිහි සම්බන්ධය ශක්තිමත් වේ. පැවිද්දන් ආධ්‍යාත්මික විමුක්තිය සඳහා ක්‍රියාකරමින් අර්ථවත් පැවිදි දිවියක් ගෙවන විට දායක පිරිසද සීලාදි ගුණධර්ම ප්‍රගුණ කිරීමට යොමු වෙති. ඔවුහු පස්පවින් හා දස අකුසල්වලින් වෙන්ව සම්මා ආජීවයෙන් දිවි ගෙවති. පුද්ගලයාට හා සමාජයට හානිකර පව්කම්වලින් ගිහිපිරිස වෙන් වූ විට දැහැමි සමාජයක් ගොඩනැගෙන අයුරු දක්වමින් ලියා ඇති ප්‍රමාණවක් පිළිතුරකට **<u>ලකුණු 08ක්</u>** ලබාදෙන්න.

(මුළු ලකුණු 18යි.)

04.

i. **උපොසථ දින හතරකි.**

- පසළොස්වක, අමාවක, පුරඅටවක, අවඅටවක

(ලකුණු 04යි.)

ii. 1. සීමා මාලකය ඇමදීම. 2. පහන් දැල්වීම.
3. බීමට හා පා සේදීමට අවශ්‍ය ජලය තැබීම. 4.ආසන පැනවීම.

උපොසථය සඳහා සංඝයා රැස්වීමට පෙර මේ කරුණු හතර සම්පූර්ණ වී තිබිය යුතුය. මෙම කරුණු සම්පූර්ණ වීම නිසා පොහොය කර්මය සිදුකිරීම සඳහා පහසු පරිසරයක් ඇතිවන ආකාරයත්, බාධාවන්ගෙන් තොරව එම විනය කර්මය සිදුකළ හැකිවීම ආදි කරුණු දක්වමින් අවශ්‍යතාවය පැහැදිලි කොට ලියා ඇති ප්‍රමාණවත් පිළිතුරට **<u>ලකුණු 06ක්</u>** ලබා දෙන්න.

iii. උපසපන් භික්ෂූන් වහන්සේලා අඩමසකට වරක් රැස්ව ඇවැත් දේශනා කොට පිරිසිදුව ප්‍රාතිමොක්ෂය දේශනා කරති. එසේ රැස්වන්නේ සමගි සංඝයායි. සීලාදියෙන් පිරිසිදු වූ, සමගි වූ, විනයට අනුව ක්‍රියාකරන මෙම පිරිස එකම කණ්ඩායමක් ලෙස පෙනී සිටිති. පොහොය විනය කර්මය අවසන් කරන්නේ සංඝස්ථ විරයන් වහන්සේ විසින් සමගිය හා පාරිශුද්ධිය පිළිබඳව නැවතත් සංඝයාට සිහිපත් කිරීමෙන් පසුවයි. මේ කරුණු ද දක්වමින් පොහොය කර්මය තුළින් සංඝ සමාජයේ සමගිය හා පාරිශුද්ධිය ඇතිවන අයුරු පැහැදිලි කොට ඇති ප්‍රමාණවත් පිළිතුරට **ලකුණු 08ක්** ලබාදෙන්න.

(මුළු ලකුණු 18යි.)

05.

i. **සිංහලයට නැගීම.**

(අ) උපාසකයා සිව්රක් ගෙන බුදුන් පුදයි.

(ආ) නුඹලා බුදුරජාණන් වහන්සේගේ ධර්මය අසව්.

(ඉ) දුටුගැමුණු මහරජු ලක්දිව පාලනය කළේය.

(ඊ) පියා පුතා සමඟ නගරයට යයි.

(2x4 = ලකුණු 08යි.)

ii. **පාලියට නැගීම.**

(අ) දායකො භික්ඛු සංඝස්ස දානං දෙති.

(ආ) භික්ඛවො භගවතො පාදෙ වන්දිංසු.

(ඉ) දෙවො වස්සතු කාලෙන.

(ඊ) මයං මාතාපිතරෙහි සද්ධිං බුද්ධං වන්දිස්සාම.

(උ) භික්ඛු ගාමං ගන්ත්වා ධම්මං දේසති.

(2x5 = ලකුණු 10යි.)

(මුළු ලකුණු 18යි.)

06.

i. **සිංහලයට නැගීම.**

පෙර බරණැස බ්‍රහ්මදත්ත රජු රජ කරවන කල්හි බෝධිසත්වයන් හිමවතෙහි ඇත් කුලයෙහි ඉපිද මුළුමනින් ~~දැකුම්කලු වූ~~, සුදු වූ දැකැමිකලු වූ දහසක් ඇතුන් පිරිවරා ගත්, ඇතෙක් විය. ඔහුගේ මව අන්ධය. හෙතෙම මිහිරි වූ පලතුරු ඇතුන්ට දී මව වෙත යවයි.

නිවැරදි පරිවර්තනයට මුළු **ලකුණු 08යි.** වචන මඟහැර ඇත්නම් හෝ වැරදි පරිවර්තන දී ඇතොත් සුදුසු පරිදි ලකුණු අඩු කරන්න.

ii. මාතුපොසක ජාතකයෙහි වර්තමාන කථාවෙහි මෙන්ම අතීත කථාවෙහිද මව පෝෂණය කළ පුවත් සඳහන් වේ. ගිහි ගෙයින් නික්ම නිර්වාණය අපේක්ෂාවෙන් පැවිදි බව ලබා සිටින භික්ෂුවක් අසරණ මවට උපස්ථාන කරයි. මෙය අගය කරන බුදුරජාණන් වහන්සේ මිනිසුන් පමණක් නොව තිරිසන් සතුන් පවා අසරණ මවට උවටැන් කළ බව දේශනා කළහ. ගුණවත් ඇත් රජෙක් අසූ දහසක පමණ ඇත් රැළ අතහැර අන්ධ මව පෝෂණය කරයි. බරණැස් රජු මේ ඇතා අල්වාගත් පසුව මව ගැනම සිතමින් අහර නොගෙන වැළපෙයි. පසුව රජුගේ කරුණාව දිනාගන්නා ඇත්රජු නිදහස ලැබ මවට උවැටැන් කරයි. මේ නිසා රජුගේ පමණක් නොව රට වැසියාගේ ද ගෞරවය ලබයි.

මෙම කථා පුවතෙන්

- මව් පියන් අසරණ වූ විට දරුවන් විසින්ම ඔවුන්ට ඇප උපකාර කළයුතු බව.
- දයාබර දරුවන් නිසා මව් පියන් බලවත් සේ සතුටට පත්වන බව.
- දරුවන් දක්නට නොලැබීම නිසා මව් පියන් බලවත් සේ දුකට පත්වන බව.
- මව් පියන් පෝෂණය කරන දරුවන් අධ්‍යාත්මික සතුටක් ලබන අතරම ඔවුන් ගුණවතුන් බවට පත්වීම.
- මෙබදු දූ දරුවන්ට සමාජයෙන් ගරුබුහුමන් ලැබෙන බව.

මෙවන් කරුණු දක්වමින් මාතුපෝසක ජාතක කථාවෙන් ලබාදෙන ආදර්ශය පෙන්වා දී ඇති සාර්ථක පිළිතුරට **ලකුණු 10ක්** ලබා දෙන්න.

(මුළු ලකුණු 18යි.)

07.

i. **සිංහලයට නැගීම.**

ඉක්බිති දිනක් මණිකණ්ඨ නම් නාග රාජයා නිවසින් නික්ම ගංතෙර මිනිස් වෙසින් ඇවිදින්නේ කණිට්ඨගේ අසපුවට ගොස් එකත් පස්ව හිඳගත්තේය. ඔවුහු එකිනෙකා සතුටු සාමීචි කථා කොට විශ්වාසවන්තයෝ වූහ.

නිවැරදි පරිවර්තනයට මුළු **ලකුණු 08යි.** වචන මඟහැර ඇත්නම් හෝ වැරදි පරිවර්තන දී ඇතොත් සුදුසු පරිදි ලකුණු අඩු කරන්න.

ii. ගෙලේ මැණිකක් ඇති (මණිකණ්ඨ) නාගරාජයා කණිටු තවුසා සමඟ මිත්‍රවෙයි. පසුව මෙම මිත්‍රත්වය බලවත් සෙනෙහසක් බවට පත්වේ. ඒ නිසා තවුසා දරන වැලෙන් වෙලාගන්නා නාගයා තාපසයා වැළඳගෙන හිස මුදුනේ පෙනය නංවා ටික වේලාවක් නිදා ගනියි.

Past Papers Wiki

මේ භයානක සිදුවීම නිසා තවුසා මහත් බියෙන් පසුවෙයි. ඒ නිසාම තවුසා ගේ සිරුර වැහැරී දුර්වර්ණ වේ. අනතුරුව දෙටු තවුසාගේ උපදෙස් පරිදි පළමුව නා රජුගේ පැමිණීම අකමැතිව ගෙලේ බැඳි මැණික ඉල්වයි. තෙවනවර දක්වා ඉල්ලීම නිසා කළකිරුණ නාරජු පලායයි. ඉන්පසු නාරජු නොදැකීමෙන් තවුසා බලවත් සේ දුකට පත්වෙයි. කරුණු අවබෝධ කරදුන් දෙටු තවුසා සොයුරු කණිටු තවුසාට සැනසුම ලබාදෙයි.

මෙම සිද්ධි දාමය මඟින් නොගැළපෙන අයගේ එක්වීමෙන් බියට පත්වීමෙන් යම් යම් දෑ තමන්ගෙන් ඉල්ලා සිටීමෙන් පුද්ගලයාගේ සිතත් ඒ අනුව කයත් වෙනස්වන අයුරු පෙන්වා දී ඇති අර්ථවත් පිළිතුරට **ලකුණු 10ක්** ලබා දෙන්න.

(මුළු ලකුණු 18යි.)

****

PAST PAPERS WIKI

රහස්‍යයි

ඇගයීම් ශාලාවෙන් පිටතට රැගෙන යාම තහනම්

2563 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය

2018 (2019)

-ලකුණු දීමේ පටිපාටිය -



(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා ප්‍රවේශය.

පරීක්ෂකවරයාගේ නම :- .....

සංකේත අංකය :- 91/2/4/10/2019/02/S/.....

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි. පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

ඇගයීම් (ආයතනික විභාග) ශාඛාව

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

පැලවත්ත, බත්තරමුල්ල

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

සියලුම හිමිකම් ඇවිරිණි.

සියලු ම හිමිකම් ඇවිරිණි [முழுப் பதிப்புரிமையுடையது] / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2563 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2018 (2019)

S 2

(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය

පැ තුනයි

I කොටසේ ප්‍රශ්නය ද, II කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

සැ.යු. I කොටසේ ප්‍රශ්නයට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියා, II කොටසේ පිළිතුරු සමග අමුණා භාරදෙන්න.

I කොටස

1. (i) බුදු දහමේ සඳහන් 'බ්‍රහ්මචර්යාව' යන්නෙහි අදහස ලියන්න. *(ලකුණු 02 යි)*

.....

.....

(ii) සැදැහැති කුල පුත්‍රයෙකු උදෙසා මහණ බමුණන් විසින් කළ යුතු යුතුකම් සිගාලෝවාද සූත්‍රයෙහි දැක්වේ. එම යුතුකම් අතුරින් දෙකක් ලියන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(iii) ගිහි පැවිදි සම්බන්ධතාව නිසා ශාසනික දියුණුවට ලැබෙන ප්‍රතිලාභ දෙකක් දක්වන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(iv) සැබෑ භික්ෂු ජීවිතයක කැපී පෙනෙන ගුණාංග අතුරින් දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(v) සාලිකේදාර ජාතකයේ දැක්වෙන හොටෙන් හැල් වී ගෙන යන ගිරා රජු 'ණයෙන් මිදෙමි ණය දෙමි' යනුවෙන් කරන ප්‍රකාශයේ අදහස ලියන්න. *(ලකුණු 02 යි)*

.....

.....

.....

(vi) සාමාන්‍ය පුද්ගලයා ගිනි එකොළසකින් දැවෙන බව ධම්මපද නිදාන කථාවක සඳහන් වේ. එසේ දැවෙන ගිනි අතුරින් දෙකක් ලියා දක්වන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(vii) බුද්ධ කාලයේ විසූ අසංවර භික්ෂූන්ගේ අගෝචර ක්‍රියාවන්ගෙන් දෙකක් ලියන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(viii) සිංහලට නගන්න.

(අ) යෙ තං න උපනය්හන්ති - වෙරං තෙසූපසම්මති. *(ලකුණු 04 යි)*

.....

.....

(ආ) අභිත්ථරෙථ කල්‍යාණෙ - පාපා චිත්තං නිවාරයෙ

.....

.....

(ix) පහත සඳහන් අදහස් ඇති ධම්මපද ගාථා නිවැරදිව ලියන්න. *(ලකුණු 04 යි)*

(අ) "යම් සේ බඹරා මලත්, එහි පැහැය හා සුවඳත් නො නසා රොත් ගෙන යන්නේ ද, මුනිවරයා එලෙස ගමේ හැසිරෙයි."

.....

.....

.....

.....

(ආ) "පෘථග්ජන පුද්ගලයා යම් කැනක නො ඇලේ ද ඒ වන පෙදෙස සික්කලු ය. රාගය නැසූ රහතන් වහන්සේ එහි ඇලෙන්නාහ. උන්වහන්සේ කම් සැප නො සොයන බැවිනි."

.....

.....

.....

.....

(x) 'අ' කොටසේ යෙදුමට ගැළපෙන යෙදුම 'ආ' කොටසෙන් තෝරා හිස්තැන් තුළ ලියන්න. *(ලකුණු 06 යි)*

'අ'		'ආ'
1. ථුල්ලතිස්ස තෙර	.....	වනයෙහි මංමුළා විය.
2. කෝසිය සිටුතුමා	.....	සොරුන්ට බත් පිසියි.
3. බරණැස වැද්දා	.....	නැයන්ට උපකාර කිරීම.
4. මහාකපි ජාතකය	.....	වෘද්ධයෙකි.
5. වටුවා	.....	මසුරෙකි.
6. පතිකෝලම්බ	.....	මුරණ්ඩුය.
		දානපතියෙකි.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි [முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

45408

2563 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2018 (2019)

(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය

S 2

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

2. (i) බ්‍රාහ්මණ සමාජයේ පැවති 'ආශ්‍රම ධර්ම' නම් කරන්න. (ලකුණු 04 යි)
(ii) ශ්‍රමණ සම්ප්‍රදාය තුළ පැවති පොදු ලක්ෂණ දෙකක් අගය කරන්න. (ලකුණු 06 යි)
(iii) බුදු දහම දඹදිව ශීඝ්‍රයෙන් පැතිර යාමට හේතු වූ කරුණු දෙකක් විස්තර කරන්න. (ලකුණු 08 යි)

3. (i) භික්ෂු සමාජයේ කෙලෙසීමට හේතුවන ආසවට්ඨානීය ධර්ම පහළ විය හැකි හේතු හතරක් නම් කරන්න. (ලකුණු 04 යි)
(ii) ආසවට්ඨානීය ධර්ම අතුරින් දෙකක් පහදා දෙන්න. (ලකුණු 06 යි)
(iii) විනය නීති පැනවීමේ අරමුණු අතුරින් හතරක් ලියා, ඒවා පහදා දෙන්න. (ලකුණු 08 යි)

4. (i) එකල දඹදිව වැසි මිනිසුන් අතර 'මංගල' යන්න පිළිබඳව පැවති මත දෙකක් මංගල සූත්‍රයෙහි නිදාන කථාව ඇසුරෙන් ලියන්න. (ලකුණු 04 යි)
(ii) 'ඉවසීම' මංගල කරුණක් වන්නේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 06 යි)
(iii) "මංගල කරුණු පිළිපදින තැනැත්තා ලෞකික දියුණුව පමණක් නොව ලෝකෝත්තර දියුණුව ද ලබා අපරාජිතව සුවසේ හැසිරෙයි." මේ අදහස පහදා දෙන්න. (ලකුණු 08 යි)

5. (i) සිගාලෝවාද සූත්‍රයෙහි දැක්වෙන සදිසා අතුරින් දිසා හතරක් ලියා ඒ හා සම්බන්ධ පුද්ගලයන් සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(ii) යහපත් දූ දරුවන් විසින් දයාබර දෙමව්පියන්ට උපස්ථාන කළ යුතු කරුණු සිගාලෝවාද සූත්‍රයෙහි සඳහන් වේ. ඒවා අතුරින් කරුණු තුනක් ලියා ඒවායෙහි අගය පහදා දෙන්න. (ලකුණු 06 යි)
(iii) මව්පියන්ගේ හා දූ දරුවන්ගේ යුතුකම් සහ වගකීම් ඉටු නොවන විට සමාජය තුළ පැන නැඟිය හැකි ගැටලු පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

6. (i) සත්තිගුම්බ ජාතකයෙහි සඳහන් ගිරා පැටවුන් දෙදෙනාට සත්තිගුම්බ හා පුෂ්පක යන නම් තැබීමට හේතුව ලියන්න. (ලකුණු 04 යි)
(ii) ආරයට වඩා පරිසරය සහ සසර පුරුද්ද පුද්ගල චර්යාවන් කෙරෙහි බලපාන අයුරු සත්තිගුම්බ ජාතකය ඇසුරින් ප්‍රකට කරන්න. (ලකුණු 06 යි)
(iii) සිංහලට නගන්න. (ලකුණු 08 යි)

අතීතෙ උත්තරපඤ්චාල නගරෙ පඤ්චාලො නාම රාජා රජ්ජං කාරෙසි. මහාසත්තො අරඤ්ඤායතනෙ එකස්මිං සානුපබ්බතෙ සිම්බලි වනෙ එකස්ස සුවරඤ්ඤො පුත්තො හුත්වා නිබ්බත්ති. ද්වෙ භාතරො අහෙසුං. කස්ස පන පබ්බතස්ස උපරි වාතෙ චොරගාමකො අහොසි, පඤ්චන්නං චොරසතානං නිවාසො. අධො වාතෙ අස්සමො, පඤ්චන්නං ඉසි සතානං නිවාසො.

(සත්තිගුම්බ ජාතකය)

7. (i) මණිකණ්ඨ ජාතකය දේශනා කිරීමට හේතු වූ සිද්ධිය (වර්තමාන කථාව) කුමක් ද? (ලකුණු 04 යි)
(ii) "යමෙකුට ප්‍රිය වූ දෙයක් ඉල්ලන තැනත්තා අප්‍රිය අයෙකු බවට පත්වේ." මේ අදහස මණිකණ්ඨ ජාතකය ඇසුරෙන් සනාථ කරන්න. (ලකුණු 06 යි)
(iii) සිංහලට නගන්න. (ලකුණු 08 යි)

තෙ උභොපි භාතරො වයප්පත්තා මාතාපිතූන්නං කාලකිරියාය සංවිග්ගහදයා ඉසිපබ්බජ්ජං පබ්බජිත්වා ගංගා තීරෙ පණ්ණසාලං මාපෙත්වා වසිංසු. තෙසු ජෙට්ඨස්ස උද්ධගඞ්ගාය පණ්ණසාලා අහොසි. කණිට්ඨස්ස අධොගඞ්ගාය. අථෙකදිවසං මණිකණ්ඨො නාම නාගරාජා භවනා නික්ඛමිත්වා ගංගාතීරෙ මාණවක වෙසෙන විචරන්තො කණිට්ඨස්ස අස්සමං ගන්ත්වා එකමන්තං නිසීදි.

PAST PAPERS WIKI

8. (i) මෙම වාක්‍ය සිංහලට නගන්න.

(අ) එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.

(ආ) සබ්බත්ථ පූජිතො හොති - යො මිත්තානං න දූභති.

(ඉ) කාකවණ්ණතිස්ස මහාරාජා රොහණෙ රජ්ජං කාරෙන්තො මහාගාමෙ පටිවසති.

(ඊ) නත්ථි මෙ සරණං අඤ්ඤං - බුද්ධො මෙ සරණං වරං.

(ලකුණු 08 යි)

(ii) මෙම වාක්‍ය පාලියට නගන්න.

(අ) මම බුදුන් දහම් සඟුන් සරණ යමි.

(ආ) මව පුතා සමග විහාරයට ගොස් දන් දුන්නාය.

(ඉ) ළමයා උදැසන ම දහම් පාසලට යන්නේ ය.

(ඊ) සියලු සත්වයෝ සුවපත් වෙත්වා.

(උ) සියලු සංස්කාරයෝ අනිත්‍ය වෙති.

(ලකුණු 10 යි)

* * *

2563 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2018 (2019)

(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය.

ලකුණු බෙදීයාම

- I වන කොටසේ ප්‍රශ්නය ද II කොටසින් තෝරාගත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතුවේ.

I කොටස.

1. ප්‍රශ්නය

   i. සිට vii දක්වා ප්‍රශ්න සඳහා ලකුණු 02 බැගිනි.

   viii. සිට ix දක්වා ප්‍රශ්න සඳහා ලකුණු 04 බැගිනි.

   x. වන ප්‍රශ්නය සඳහා ලකුණු 06යි.

(ලකුණු 28යි.)

II කොටස.

2. ප්‍රශ්නය සිට 8. වන ප්‍රශ්නය දක්වා

   i. කොටස සඳහා ලකුණු 04යි.

   ii. කොටස සඳහා ලකුණු 06යි.

   iii. කොටස සඳහා ලකුණු 08යි.

(ලකුණු 18යි.)

- I කොටසට ලකුණු **28**
- II කොටසට ලකුණු **4 x 18** **72**

මුළු ලකුණු (28+72=100යි.)

ලකුණු දීමේ පටිපාටිය

I කොටස

1.

i. කාම සේවනයෙන් තොර වූ වාසය බ්‍රහ්මචර්යාවයි.
ගිහි ගෙයින් වෙන්වීම, පැවිදි ජීවිතයක් ගත කිරීම.

(ලකුණු 02යි.)

ii. පහත සඳහන් කරුණු අතරින් දෙකක් ලියා තිබිය යුතුය.

- පව්කම්වලින් වළක්වති.
- සුචරිතෙහි යොදවති.
- යහපත් සිතින් අනුකම්පා කරති.
- නො ඇසූ ධර්මය අස්වති.
- ඇසූ ධර්මය පිරිසිදු කරති.
- දෙව් ලොවට මඟ කියා දෙති.

(ලකුණු 02යි.)

iii.

- ශාසනික ආරක්ෂාව ඇති වීම.
- සිව් පසය ලැබීමෙන් භික්ෂූන් වහන්සේලාගේ සුඛ විහරණය ඇති වීම.
- වෙහෙර විහාරස්ථානවල දියුණුව ඇති වීම.
- ධර්මයේ ව්‍යාප්ත ඇති වීම.
- ගිහීන්ට ධර්මානුකූලව ජීවත් වීමට හැකි වීම.

මේ ආදී කරුණු දෙකක් සඳහන් විය යුතුය.

(ලකුණු 02යි.)

iv.

- සුපටිපන්න ආදී ගුණ
- ඉවසීම.
- ලද දෙයින් සතුටු වීම.
- ආදර්ශවත් බව.
- සත්‍ය කථා කිරීම.
- කරුණා මෛත්‍රීය

මේ ආදී ගුණාංග අතරින් දෙකක් දක්වා තිබීම. (ලකුණු 02යි.)

D:\format\2019\Dinusha\mr rajapaksh\බෞද්ධ ධර්මාචාර්ය විභාගය\ලකුණු දීමේ පටිපාටි\(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය.docx

Past Papers Wiki

v.

- ණය දීම - කුඩා ගිරා පැටවුන් පෝෂණය කිරීම.
- ණයෙන් මිදීම - මව් පිය දෙපල පෝෂණය කිරීම.

(ලකුණු 02යි.)

vi.

- රාග
- දොස
- මොහ
- ව්‍යාධි
- ජරා
- මරණ
- සොක
- පරිදේව
- දුක්ඛ
- දොමනස්ස
- උපායාස

(ලකුණු 02යි.)

vii.

- 1. ඡබ්බග්ගිය භික්ෂූන් සතළොස්වග භික්ෂූන්ට පහර දීම.
  2. එම භික්ෂූන් බිය ගැන්වීම.
  3. ථුල්ලතිස්ස තෙරුන් බුද්ධ අවවාද නොපිළිගැනීම.
  4. දෙව්දත් තෙරුන් බුදුරජාණන් වහන්සේට ගලක් පෙරළීම.
  5. ඡබ්බග්ගිය භික්ෂූන් වැඩිහිටි භික්ෂූන්ට ගරු නොකිරීම.

මෙබඳු සිද්ධි දෙකක් ලියා තිබිය යුතුය. (ලකුණු 02යි.)

viii.

(අ) යමෙක් නැවත නැවත වෛර නොබඳින් ද ඔහුගේ එම වෛරය සංසිඳේ.

(ලකුණු 02යි.)

(ආ) කුසලයෙහි යුහුසුලුවිය යුතුය. සිත පවින් වැළකිය යුතුය. **(ලකුණු 02යි.)**

ix. (අ)

යථාපි භමරො පුප්ඵං - වණ්ණගන්ධං අහෙඨයං
පලෙති රසමාදාය - එවං ගාමෙ මුනි චරේ

(ලකුණු 02යි.)

(ආ)

රමණීයානි අරඤ්ඤානි - යත්ථ න රමතී ජනෝ
වීතරාගා රමෙස්සන්ති - න තෙ කාමගවෙසිනෝ

(ලකුණු 02යි.)

PAST PAPERS WIKI

x.

- ථුල්ලතිස්ස තෙර - මුරණ්ඩුය.
- කෝසිය සිටුතුමා - මසුරෙකි.
- බරණැස වැද්දා - වනයෙහි මං මුළා විය.
- මහාකපි ජාතකය - නෑයන්ට උපකාර කිරීම.
- වටුවා - වෘද්ධයෙකි.
- පතිකෝලම්භ - සොරුන්ට බත් පිසයි.

(ලකුණු 06යි.)

II කොටස

2.

i. 1. බ්‍රහ්මචාරි

2. ගෘහස්ථ

3. වානප්‍රස්ථ

4. සන්‍යාසි

(ලකුණු 04යි.)

ii. 1. තාපස චර්යා හෙවත් ආධ්‍යාත්මික සංවර්ධනය කෙරෙහි ඇල්මක් දැක්වීම.

2. අනගාරික ජීවන මාර්ගයට නැඹුරු වීම.

3. යාග විධි ප්‍රතික්ෂේප කිරීම.

මෙම කරුණු අතරින් දෙකක් දක්වා ඒවා අගය කරමින් ලියා ඇති පිළිතුරකට ප්‍රමාණවත් ලකුණු ලබා දෙන්න.

(ලකුණු 06යි.)

iii.

- ධර්ම දූත පිරිසේ විශේෂ සුදුසුකම් හා හැකියාවන්
- ධර්මයෙහි පවත්නා විශිෂ්ටත්වය.
- ගිහි දායක පිරිසේ අනුග්‍රහය.
- බුද්ධ කාලයේ පැවති සමාජ තත්ත්වය.
- බුදුරජාණන් වහන්සේගේ විශිෂ්ට ගුණ.

මෙබඳු කරුණු දෙකක් විස්තර කොට ඇති පිළිතුරකට ප්‍රමාණවත් ලකුණු දෙන්න.

(ලකුණු 08යි.)

D:\format\2019\Dinusha\mr rajapaksh\බෞද්ධ ධර්මාචාර්ය විභාගය\ලකුණු දීමේ පටිපාටි\(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය.docx

3.

i. 1. සංඝයා සංඛ්‍යා වශයෙන් විශාලත්වයට පත්වීම. (මහත්තතා)

2. සිව් පසය විශාල වශයෙන් ලැබීම. (ලාභග්ගතා)

3. සංඝයා පිළිබඳ මහත් කීර්තියක් පැතිර යාම. (යසග්ගතා)

4. බොහෝ ඇසූ පීරු තැන් ඇති බව. (බහුස්සුකතා)

5. පැවිදිව කලක් ගත වීම නිසා වැඩිහිටියෙකු වශයෙන් ලබන දැනීම. (රත්තඤ්ඤුතා)

මෙම කරුණු අතරින් හතරක් දක්වා තිබිය යුතුය.

(ලකුණු 04යි.)

ii. ආසවට්ඨානිය ධර්ම ඇති වීමට හේතු වන කරුණු දෙකක් විස්තර කොට ඇති පිළිතුරකට ප්‍රමාණවත් ලකුණු ලබා දෙන්න.

(ලකුණු 06යි.)

iii.

- භික්ෂු සමාජයේ පැවැත්මට හානිවන කරුණු නිවාරණය කිරීම.
- සංඝයාගේ යහපත.
- සංඝයාගේ සුව පහසුව.
- දුශ්ශීල අලජ්ජී පුද්ගලයන්ට නිග්‍රහ කිරීම.
- සීලය ප්‍රිය කරන භික්ෂූන්ගේ පහසු විහරණය.
- මේ ජීවිතයේ දී ලැබෙන දුක් කරදර වළක්වා ගැනීම.
- පරලොව දී ළඟා විය හැකි දුක් විපාක නැති කිරීම.
- නො පැහැදුණුවන්ගේ ප්‍රසාදය වැඩි වීම.
- පැහැදුණුවන්ගේ ප්‍රසාදය වැඩි වීම.
- සද්ධර්මයේ චිර පැවැත්ම.
- විනය ශික්ෂණය සඳහා රුකුළක් වීම.

මෙහි දැක්වෙන කරුණු අතරින් හතරක් දක්වා ඒවා ප්‍රමාණවත් ලෙස පහදා දී ඇති පිළිතුරකට මුළු ලකුණු ප්‍රදානය කරන්න.

(ලකුණු 08යි.)

D:\format\2019\Dinusha\mr rajapaksh\බෞද්ධ ධර්මාචාර්ය විභාගය\ලකුණු දීමේ පටිපාටි\(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය.docx

4.

i. දිට්ඨ මංගලික - ඇසට පෙනෙන දෙය මංගල වේ.

සුත මංගලික - කණට ඇසෙන දෙය මංගල වේ.

මුත මංගලික - නාසයට දැනෙන සුවඳ. දිවට දැනෙන රසය, සිරුරට දැනෙන ස්පර්ශය මංගල වේ.

මෙම කරුණු අතරින් දෙකක් දැක්විය යුතුය.

(ලකුණු 04යි.)

ii. ගෘහ ජීවිතයේ දී මෙන්ම සමාජ ජීවිතයේ දී ද ඉවසීම දියුණු කරගත් තැනැත්තා බොහෝ ප්‍රතිඵල ලබයි. යම් අරමුණක් වෙත ළඟා වීමට ද ඉවසීම අවශ්‍ය වේ. අධ්‍යාත්මික ජීවිතයේ ද ඉවසීම ප්‍රගුණ කළ යුතුව ඇත. මේ කරුණු ඇතුළත්ව ඉවසීම මංගල කරුණක් වන හැටි විස්තර කළ පිළිතුරකට මුළු ලකුණු ප්‍රදානය කරන්න.

(ලකුණු 06යි.)

iii. මංගල සූත්‍රයෙහි මංගල කරුණු 38ක් දැක්වේ. ඉන් 32ක් ලෞකික දියුණුවට ද 6ක් ලෝකෝත්තර දියුණුවට ද හේතු වේ. ලොකෝත්තර දියුණුව සඳහා වන මංගල කරුණු,

1. චතුරාර්ය සත්‍ය අවබෝධ කිරීම.
2. නිර්වාණය සාක්ෂාත් කිරීම.
3. අටලෝ දහමෙහි කම්පා නොවීම.
4. ශෝක රහිත බව.
5. කෙලෙස් රහිත බව.
6. සිත කෙලෙසුන්ගෙන් නිදහස් වීම.

මෙම කරුණු අතරින් තුනක්වත් දක්වා මංගල කරුණු ලෝකෝත්තර දියුණුව ඇති කරන හැටි විස්තර කොට ලියා ඇති පිළිතුරකට ප්‍රමාණවත් ලකුණු ප්‍රදානය කරන්න.

(ලකුණු 08යි.)

D:\format\2019\Dinusha\mr rajapaksh\බෞද්ධ ධර්මාචාර්ය විභාගය\ලකුණු දීමේ පටිපාටි\(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය.docx

5.

i.

නැගෙනහිර දිසාව	-	මවු පිය
දකුණු දිසාව	-	ආචාර්යවරු
බස්නාහිර දිසාව	-	අඹුදරුවෝ
උතුරු දිසාව	-	මිත්‍රයෝ
යට දිසාව	-	දැසි දස් කම්කරුවෝ
උඩ දිසාව	-	මහණ බමුණෝ

මේ කරුණු අතරින් කරුණු හතරක් ලියා ඇති පිළිතුරට මුළු ලකුණු ප්‍රදානය කරන්න.

(ලකුණු 04යි.)

ii.

- 1. දෙමව්පියන් පෝෂණය කිරීම.
  2. දෙමව්පියන්ගේ කටයුතු කිරීම.
  3. කුල පරම්පරාව රැකීම.
  4. මව් පියන් සතු වස්තුව ආරක්ෂා කිරීම.
  5. මියගිය දෙමව්පියන්ට පිං දීම.

  මේ කරුණු අතරින් තුනක් ලියා එහි අගය පහදා දී ඇති පිළිතුරට ප්‍රමාණවත් ලකුණු ප්‍රදානය කරන්න.

(ලකුණු 06යි.)

iii.

- **දරුවන් විසින් දෙමව්පියන්ට කළයුතු උස්ථාන**

  1. දෙමව්පියන් පෝෂණය කිරීම.
  2. දෙමව්පියන්ගේ කටයුතු කිරීම.
  3. කුල පරම්පරාව රැකීම.
  4. මව්පියන් සතු වස්තුව ආරක්ෂා කිරීම.
  5. මියගිය දෙමව්පියන්ට පිං පෙත් දීම.

- **දෙමාපියන් විසින් දරුවන්ට අනුකම්පා කළ යුතු කරුණු**

  1. පවින් වළක්වයි
  2. යහපතෙහි යොදවයි
  3. ශිල්ප ශාස්ත්‍ර උගන්වයි

D:\format\2019\Dinusha\mr rajapaksh\බෞද්ධ ධර්මාචාර්ය විභාගය\ලකුණු දීමේ පටිපාටි\(02) බෞද්ධ විනය පාර්ශය හා පාලි භාෂා පරිවිය.docx

4. සුදුසු භාර්යාවක ආවාහ කරදෙයි

5. සුදුසු කල්හි දායාද පවරා දෙයි

ඉහත සඳහන් කරුණු ද ඇතුළත්ව මව්පියන්ගේ හා දූ දරුවන්ගේ යුතුකම් වගකීම් ඉටු නොවන විට සමාජය තුළ පැන නැගිය හැකි ගැටළු විස්තර කරමින් ලියා ඇති සාර්ථක පිළිතුරට මුළු ලකුණු ප්‍රදානය කරන්න.

(ලකුණු 08යි.)

6.

i.

- සුළි සුළඟට ගසා ගෙන ගිය එක් ගිරා පැටවකු සොර ගමෙහි සොරුන්ගේ ආයුධ අතරට වැටුණු නිසා ඔහුට සත්තිගුම්බ යන නම තබන ලදී.
  අසපුවෙහි වැලි තලාවෙහි මල් අතරට වැටුණු නිසා අනිත් ගිරා පැටවාට පුෂ්පක යන නම තබන ලදී.

(ලකුණු 04යි.)

ii.

- සත්තිගුම්බ හා පුෂ්පක යන ගිරවුන් දෙදෙනා එක මවකගේ පැටව් ය. එහෙත් සොරුන් අතර වැඩුණු සත්තිගුම්බ සොරුන්ගේ ගතිගුණ අනුව හැඩ ගැසුණු අතර සසර ද ඔහු පව්කම් කළ පාපීන් පිරිවරා සිටි අයෙකු බැවින් සසර පුරුද්ද අනුව ද ක්‍රියා කළේය.

  පුෂ්පක ගිරවා තවුසන් අතර වැඩුණු බැවින් තවුසන්ගේ ගතිගුණ පිහිටියේ ය. එමෙන්ම එම ගිරවා බෝසතුන් බැවින් සසර යහපත් ක්‍රියා පුහුණු කළ අයෙකි.

  මෙම කරුණු දක්වමින් ආරයට වඩා පරිසරය හා සසර පුරුද්ද පුද්ගල චර්යාවන් කෙරෙහි බලපාන අයුරු දක්වමින් ලියා ඇති සාර්ථක පිළිතුරකට මුළු ලකුණු පිරිනමන්න.

(ලකුණු 06යි.)

iii.

- පෙර උත්තර පඤ්චාල නුවර පඤ්චාල නම් රජෙක් රාජ්‍යය කරවීය. මහසත් තෙමේ මහ වනයෙහි එක් කඳුරැලියක ඉඹුල් වනයෙහි ගිරා රජෙකුට පුත්ව උපන්නේ ය. සොයුරෝ දෙදෙනෙක් වූහ. එම කන්දෙහි උඩු සුළඟ දිසාවට සොර ගමක් විය. සොරුන් පන්සියයක ගෙවල් විය. යටි සුළඟ දිසාවට තවුසන් පන්සියයක් වසන අසපුවකි.

(ලකුණු 08යි.)

D:\format\2019\Dinusha\mr rajapaksh\බෙදාදෙ ධර්මාචාර්ය විභාගය\ලකුණු දීමේ පටිපාටි\(02) බෙදාදෙ විභාග මාර්ගය හා සාලි භාෂා පරිවර්ය.docx

7.

i.

- අලව් නුවර වැසි භික්ෂූහු ඉල්වාගත් භාණ්ඩවලින් කුටි සාදති. නිතර අත් වැඩට මිනිසුන් ඉල්ලති. මේ ඉල්ලීම් නිසා භික්ෂූන් දුටු විට මිනිස්සු පලා යති. දිනක් මහාකාශ්‍යප මහ රහතන් වහන්සේ අලව් නුවර පිඬු සිඟා වඩින විට මිනිස්සු පෙර සේ ක්‍රියා කළහ. ඊට හේතුව දැනගත් උන්වහන්සේ සිද්ධිය බුදුරජාණන් වහන්සේට ප්‍රකාශ කළහ. භික්ෂූන් කැඳවූ බුදුරජාණන් වහන්සේ මෙසේ ඉල්ලීමට මිනිසුන් අකැමැති බවත් සත් රුවනෙන් පිරි නා විමනෙහි නාගයන් පවා නිතර ඉල්ලීමට අකැමැති බවත් දේශනා කොට මේ ජාතකය වදාළ සේක.

(ලකුණු 04යි.)

ii. මණිකණ්ඨ නා රජ බාල තවුසා කෙරෙහි මහත් සෙනෙහසක් දැක්වීය. මේ නාගයා සතු බලවත් මැණිකක් වූ අතර තවුසා ඒ මැණික නැවත නැවත ඉල්ලන ලදී. මේ ඉල්ලීම නිසා බියට පත් නා රජ ඔබ පමණ ඉක්මවා ඉල්ලන්නේය. ඔබේ අසපුවටවත් නො එන්නෙමි කියා ගියේය.

මෙම ප්‍රවෘත්තිය ද ගෙන හැර දක්වමින් යමෙකුට ප්‍රිය දෙයක් ඉල්ලන තැනැත්තා අප්‍රිය අයෙකු බවට පත්වන අයුරු පෙන්වා දෙමින් ලියා ඇති සාර්ථක පිළිතුරකට මුළු ලකුණු ප්‍රදානය කරන්න.

(ලකුණු 06යි.)

iii.

- ඒ සොහොයුරන් දෙදෙනා වියපත්ව මව්පියන් කලුරිය කළ පසුව සංවේගයට පත් හදින් තවුස් පැවිද්ද ලබා ගංතෙර පන්සල් කරවා විසූහ. ඔවුන් අතුරින් වැඩිමහල්ලාගේ පන්සල ගඟෙහි ඉහළ ද, බාලයාගේ පන්සල ගඟ පහළ ද විය. ඉක්බිති දිනක් මණිකණ්ඨ නම් නා රජ නිවසින් නික්ම ගංතෙර තරුණයෙකු වෙසින් ඇවිදින්නේ කණිටු තවුසාගේ අසපුවට ගොස් එකත් පසක හුන්නේය.

(ලකුණු 08යි.)

8.

i.

(අ) **එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථ පිණ්ඩිකස්ස ආරාමෙ**

එක් සමයක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේපිඬු සිටුවරයාගේ ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

(ලකුණු 02යි.)

D:\format\2019\Dinusha\mr rajapaksh\බෞද්ධ ධර්මාචාර්ය විභාගය\ලකුණු දීමේ පටිපාටි\(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය.docx

(ආ) **සබ්බත්ථ පූජිතො හොති - යො මිත්තානං න දූහති**

යමෙක් මිත්‍රයන්ට ද්‍රෝහි නොවේ නම් සියලු තැන්හි පුද ලද්දේ වේ.

(ලකුණු 02යි.)

(ඉ) **කාකවණ්ණතිස්ස මහා රාජා රොහණේ රජ්ජං කාරෙන්තෙ මහාගාමෙ පටිවසති**

කාවන්තිස්ස මහ රජ රුහුණෙහි රජ කරන්නේ මාගම වාසය කරයි.

(ලකුණු 02යි.)

(ඊ) **නත්ථි මෙ සරණං අඤ්ඤං - බුද්ධො මෙ සරණං වරං**

උතුම් බුදුරජාණන් වහන්සේගේ පිහිට හැර මට වෙනත් පිහිටක් නැත.
(මට වෙනත් පිහිටක් නැත. මට උතුම් පිහිට බුදු රජ ය.)

(ලකුණු 02යි.)

ii.

(අ) **මම බුදුන් දහම් සඟුන් සරණ යමි.**

අහං බුද්ධං ධම්මං සංඝං සරණං ගච්ඡාමි.

(ලකුණු 02යි.)

(ආ) **මව පුතා සමඟ විහාරයට ගොස් දන් දුන්නාය.**

මාතා පුත්තෙන සද්ධිං විහාරං ගන්ත්වා දානං දදි. (අදදි / අදාසි)

(ලකුණු 02යි.)

(ඉ) **ළමයා උදෑසනම දහම් පාසලට යන්නේ ය.**

බාලකො පාතොව ධම්ම පාඨසාලායං ගච්ඡිස්සති. (ගමිස්සති)

(ලකුණු 02යි.)

(ඊ) **සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා**

සබ්බේ සත්තා සුඛී / සුඛිතා / සුඛිතතතා හොන්තු

(ලකුණු 02යි.)

(උ) **සියලු සංස්කාර අනිත්‍යයි**

සබ්බේ සංඛාරා අනිච්චා

(ලකුණු 02යි.)

- ****** -

D:\format\2019\Dinusha\mr rajapaksh\බෞද්ධ ධර්මාචාර්ය විභාගය\ලකුණු දීමේ පටිපාටි\(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය.docx

රහස්‍ය ඒ

කරුණාකර මෙම ලකුණු දීමේ පටිපාටිය ඇගයීම් ශාලාවෙන් පිටතට ගෙනයාමේ වලකින්න

2564 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2019 (2022)

ලකුණු දීමේ පටිපාටිය



(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය

පරීක්ෂකවරයාගේ නම :- .....

සංකේත අංකය :- 91/3/2/01/2022/02/S/.....

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

සියලුම හිමිකම් ඇවිරිණි.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2564 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2019 (2022)

S 2

(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය

පැය තුනයි

අතිරේක කියවීම් කාලය - මිනිත්තු 10 යි.

I කොටසේ ප්‍රශ්නය ද, **II** කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
සැ.යු. **I** කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලියා, **II** කොටසේ පිළිතුරු පත්‍ර සමග අමුණා භාරදෙන්න.

I කොටස

1. (i) බුදු දහමේ ඉගැන්වෙන නොකළ යුතු වෙළඳාම් අතුරින් දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(ii) මද්‍යසාර භාවිතය නිසා ඇතිවන දෝෂ දෙකක් දක්වන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(iii) භික්ෂුවකට අයත් සිව්පසය පිළිවෙළින් ලියන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(ඊ) .....

(iv) භික්ෂු ජීවිතය 'පරපටිබද්ධ' වේ. මෙහි අදහස කෙටියෙන් ලියන්න. *(ලකුණු 02 යි)*

.....

.....

.....

(v) ධම්මපද නිදාන කථාවක සඳහන් රජගහ නුවර මච්ඡරිය කෝසිය සිටුවරයාගේ චරිත ලක්ෂණ දෙකක් දක්වන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(vi) යහපත් බෞද්ධයකු තුළින් හඳුනාගත හැකි ආචාරධර්ම හතරක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(ඊ) .....

[2 වැනි පිටුව බලන්න.

(vii) සත්තිගුම්බ ජාතකයෙහි සඳහන් පුෂ්පක ගිරවා පඤ්චාල රජුට දැක් වූ තාපසාරාමයේ පැවති ගුණාංග දෙකක් දක්වන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(viii) පහත සඳහන් පාලි පාඨ සිංහලට නගන්න. *(ලකුණු 04 යි)*

(අ) අත්තානං උපමං කත්වා - න හනෙය්‍ය න ඝාතයේ

.....

.....

(ආ) න පරේසං විලෝමානි - න පරේසං කතාකතං

.....

.....

(ix) පහත සඳහන් අදහස් ඇතුළත් ධම්මපද ගාථා ලියන්න. *(ලකුණු 04 යි)*

(අ) යම් කර්මයක් කිරීමෙන් පසුතැවෙන්නට සිදුවේ ද, යම් කර්මයක විපාක කඳුළු පැකි මුහුණින් හඬමින් විඳින්ට සිදුවේ ද, ඒ කර්මය නොකිරීම මැනවි.

.....

.....

.....

.....

(ආ) අර්ථවත් යම් එක් පදයක් අසා කෙලෙස් සංසිඳේ ද, අනර්ථය සලසන වචන දහසකටත් වඩා ඒ එක් පදය උතුම් වේ.

.....

.....

.....

.....

(x) 'අ' කොටසේ යෙදුමට ගැළපෙන යෙදුම 'ආ' කොටසෙන් තෝරා හිස්තැන් තුළ ලියන්න. *(ලකුණු 06 යි)*

'අ'		'ආ'
වැඩිහිටියන්ට ගරු කිරීම	.....	ගුණවත් බව
ස්වර්ගගාමී මාර්ගය කීම	.....	සැබෑ නායකයා
බාහුසච්ච	.....	මහ මඟ රහත්වීම
නන්ද ගොපල්ලා	.....	තිත්තිර බ්‍රහ්මචර්යාව
බෝසත් වඳුරු රජ	.....	උගත්කම
දාරුචීරිය	.....	භික්ෂුවගේ යුතුකම
		බඹසර හැසිරීම

**

2564 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2019 (2022)

(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය

S 2

● ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

1. (i) බෞද්ධ සමාජධර්ම විෂයයෙහි උගන්වනු ලබන ආකාරයට උපයන ලද වස්තුව වර්ධනයට හේතුවන කරුණු හතරක් ව්‍යග්ඝපජ්ජ සූත්‍රය ඇසුරෙන් ලියන්න. *(ලකුණු 04 යි)*

(ii) යහපත් සමාජයක් බිහිවීමට ඉහත (i) හි සඳහන් කළ කරුණු පිළිපැදීමේ වැදගත්කම පහදා දෙන්න. *(ලකුණු 06 යි)*

(iii) මනා ගිහි පැවිදි සම්බන්ධතාවක් පවත්වා ගැනීමේ අවංක චේතනාව ඇති සැදැහැවත් දායකයකු තුළ තිබිය යුතු ගුණාංග තුනක් සිගාලෝවාද සූත්‍රය ඇසුරෙන් විස්තර කරන්න. *(ලකුණු 08 යි)*

2. (i) වෛරය කවර කලෙකවත් නොසන්සිඳී පවත්නේ කුමන හේතුවක් නිසා දැයි ධම්මපද ගාථා ඇසුරෙන් ලියන්න. *(ලකුණු 04 යි)*

(ii) වෛර කිරීම නිසා අතිශයින් කටුක දුක් විපාක විඳීමට සිදුවන අයුරු ධම්මපද නිදාන කථාවක් ඇසුරෙන් පහදා දෙන්න. *(ලකුණු 06 යි)*

(iii) "උපමා භාවිතය මඟින් ධර්ම කරුණු පහසුවෙන් වටහා ගත හැකිවේ." මේ අදහස ධම්මපදය ඇසුරෙන් විස්තර කරන්න. *(ලකුණු 08 යි)*

3. (i) සතර සංග්‍රහ වස්තු පිළිවෙළින් ලියා දක්වන්න. *(ලකුණු 04 යි)*

(ii) සතර සංග්‍රහ වස්තු සිගාලෝවාද සූත්‍රය ඇසුරෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) යහපත් රාජ්‍ය පාලනයක් ගොඩනඟා ගැනීමට කැමති පාලකයකුට සතර සංග්‍රහ වස්තු පිළිපැදීමේ වැදගත්කම පහදා දෙන්න. *(ලකුණු 08 යි)*

4. (i) විනයෙහි සඳහන් පෙර වස් හා පසු වස් විසීමට නියමිත දින දෙක ලියන්න. *(ලකුණු 04 යි)*

(ii) සංඝ සාමාග්‍රිය හා සුහදත්වයත්, භික්ෂූන් වහන්සේලාගේ පාරිශුද්ධියත් ලඟාකර ගැනීම පිණිස වස් පවාරණ විනය කර්මයෙන් ලැබෙන අනුබලය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) වස් විසීම හා කඨින පිංකම් පැවැත්වීම ගිහි පැවිදි සම්බන්ධය ශක්තිමත් කරන සාර්ථක ක්‍රමයක් වන ආකාරය විස්තර කරන්න. *(ලකුණු 08 යි)*

5. (i) මහාකපි ජාතක කථාවෙහි සඳහන් බෝසත් වඳුරු රජු තුළ පැවති යහපත් චරිත ලක්ෂණ දෙකක් ලියන්න. *(ලකුණු 04 යි)*

(ii) උසස් ජීවිතයක් ගොඩනඟා ගැනීමට උනන්දුවක් දක්වන පුද්ගලයකුට ඉහත (i) හි සඳහන් චරිත ලක්ෂණ දෙක අනුගමනය කිරීමේ වැදගත්කම විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(iii) මෙම පාඨය සිංහලට නගන්න.

සත්ථා ජෙතවනෙ විහරන්තෝ ඤාතත්ථචරියං ආරබ්භ කථෙසි. වත්ථු භද්දසාල ජාතකෙ ආවිභවිස්සති. තදා පන ධම්මසභායං කථා සමුට්ඨාපෙසුං. ආවුසො සම්මාසම්බුද්ධො ඤාතකානං අත්ථං චරතීති. සත්ථා ආගන්ත්වා කායනුත්ථ භික්ඛවෙ එතරහි කථාය සන්නිසින්නාති පුච්ඡිත්වා ඉමාය නාමා'ති වුත්තේ න භික්ඛවෙ ඉදානේව පුබ්බෙපි තථාගතො ඤාතීනං අත්ථං චරතෙවා'ති වත්වා අතීතං ආහරි. *(ලකුණු 08 යි)*

6. (i) තිරිසන් සතුන් පවා මව්පියන් පෝෂණය කරන බව දැක්වෙන ජාතක කථා දෙකක නම් ලියන්න. *(ලකුණු 04 යි)*

(ii) ඉහත (i) හි සඳහන් ජාතක කථා ඇසුරෙන් මව්පිය දූ දරු සෙනෙහස තුළින් ගොඩනැගෙන සුන්දරත්වය අගය කරන්න. *(ලකුණු 06 යි)*

(iii) මෙම පාඨය සිංහලට නගන්න.

සත්ථා පන තං භික්ඛුං පක්කොසාපෙත්වා "සච්චං කිර ත්වං භික්ඛු ගිහි පොසෙසි"ති පුච්ඡිත්වා "සච්චං භන්තෙ" ති වුත්තෙ "කිං තෙ හොන්ති" ති, "මාතාපිතරො මෙ භන්තෙ" ති වුත්තේ "සාධු භික්ඛු පොරාණක පණ්ඩිතා තිරච්ඡානා හුත්වා සුව යොනියං නිබ්බත්තිත්වා"පි ජිණ්ණකෙ මාතාපිතරො කුලාවකෙ නිපජ්ජාපෙත්වා මුඛතුණ්ඩකෙන ගොචරං ආහරිත්වා පොසෙසුං" ති වත්වා අතීතං ආහරි. *(ලකුණු 08 යි)*

7. (i) පහත වාක්‍ය සිංහලට නගන්න.

(අ) භික්ඛවෝ තදා භගවතෝ පාදෙ වන්දිංසු.

(ආ) උපාසකෝ දානං දත්වා සීලං රක්ඛිත්වා සග්ගෙ නිබ්බත්ති.

(ඉ) අතීතෙ රාජගහෙ මගධරාජා රාජානාම රජ්ජං කාරෙසි.

(ඊ) ඉත්ථී යාචකානං ආහාරං අදදි. *(ලකුණු 08 යි)*

(ii) පහත වාක්‍ය පාලියට නගන්න.

(අ) මම පාසලට ගොස් ඉගෙන ගනිමි.

(ආ) නුඹලා සතුන් නො මරව්.

(ඉ) මම මේ මල්වලින් බුදුන් පුදමි.

(ඊ) භික්ෂුව ධර්ම දේශනා කිරීමට ගමට යන්නේ ය.

(උ) ඒ දේවතාවා ගාථාවකින් භාග්‍යවතුන් වහන්සේට මෙසේ ප්‍රකාශ කළේ ය. *(ලකුණු 10 යි)*

* * *

2564 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2019 (2022)

(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය

ලකුණු බෙදී යාම

I කොටසේ සියලුම ප්‍රශ්නවලට ද II කොටසෙන් ප්‍රශ්න හතරක් ද ඇතුළත්වන සේ ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සැපයීම අපේක්ෂිතයි.

I කොටස

(i) සිට (vii)දක්වා ලකුණු 2 බැගින් 2×7 = 14යි

(viii) සිට (ix) දක්වා ලකුණු 4 බැගින් 4×2 = 08යි

(x) ලකුණු 1 බැගින් 1×6 = ලකුණු 06යි

I කොටසට නියමිත මුලු ලකුණු 28යි.

II කොටස

ප්‍රශ්න අංක 1 සිට 6 දක්වා

(i) කොටස	ලකුණු 04යි
(ii) කොටස	ලකුණු 06යි
(iii කොටස	ලකුණු 08යි
එකතුව	ලකුණු 18යි

ප්‍රශ්න අංක 7

(i) කොටස -	ලකුණු 08යි
(ii) කොටස -	ලකුණු 10යි
එකතුව	ලකුණු 18යි

I කොටසට ලකුණු	**28යි**
II කොටස ලකුණු	**72යි**
මුළු ලකුණු	**100යි**

ලකුණු දීමේ පටිපාටිය

I කොටස

1.

(i)

- ❖ සතුන් වෙළඳාම
- ❖ ආයුධ වෙළඳාම
- ❖ මස් වෙළඳාම
- ❖ මද්‍යසාර වෙළඳාම
- ❖ විෂ වෙළඳාම

(කරුණු දෙකක් සඳහා 1x2 ලකුණු 02යි)

(ii)

- ❖ ධනය පිරිහීම
- ❖ කෝලහාල ඇතිවීම
- ❖ රෝග පීඩා ඇතිවීම
- ❖ අපකීර්තිය ඇතිවීම
- ❖ ලැජ්ජාව නැතිවීම
- ❖ නුවණ දුර්වල වීම

(කරුණු දෙකක් සඳහා 1x2 ලකුණු 02යි)

(iii)

(අ) චීවර

(ආ) පිණ්ඩපාත

(ඉ) සේනාසන

(ඊ) ගිලාන ප්‍රත්‍යය

(පිළිවෙල වෙනස් නම් ලකුණු 1යි)

(1/2x4 - ලකුණු 02යි)

(iv) භික්ෂූන් වහන්සේගේ ජීවන පැවැත්ම අනුන්ට අයත්ය

(ලකුණු 02යි)

(v)

- ❖ තද මසුරෙකි
- ❖ අනිකෙකුට කිසිවක් නොදෙයි
- ❖ ආසාවන් සඟවාගෙන සිටියි
- ❖ ධර්මාවබෝධය ලැබීමට තරම් බුද්ධිමත් අයෙකි

මෙබඳු චරිත ලක්ෂණ දෙකක් ලියා තිබිය යුතු ය.

(කරුණු දෙකක් සඳහා 1x2 ලකුණු 02යි)

(vi)

- ❖ මහණ බමුණන්ට ගරු කිරීම හා ආහාර පාන දීම
- ❖ මව්පියන්ට උපස්ථාන කිරීම
- ❖ අඹුදරුවන්ට සංග්‍රහ කිරීම
- ❖ පිදිය යුත්තන් පිදීම

මංගල, පරාභව, වසල, සිඟාලෝවාද ආදී සූත්‍ර ඇසුරෙන් දක්වා ඇති ආචාර ධර්ම හතරක් දක්වා තිබිය යුතු ය.

(1/2x4 - ලකුණු 02යි)

(vii) සත්‍යය, ධර්මය, අහිංසාව, භික්ෂීම, දමනය මේ කරුණු අතරින් ගුණාංග දෙකක් ලියා තිබිය යුතු ය.

(1x2 - ලකුණු 02යි)

(viii)

(අ) අනුන් තමා මෙන් සළකා හිංසා නොකළ යුතු ය. කිසිවෙකු ලවා හිංසා නොකරවිය යුතු ය.

(ආ) අනුන්ගේ බැණුම් දෙඩුම් බස් ද, අනුන් කළ නොකළ දේ ද නොබැලිය යුතු ය.

(2x2 - ලකුණු 04යි)

(ix)

(අ) න තං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති
යස්ස අස්සමුඛො රොදං - විපාකං පටිසේවති

(ආ) සහස්සම්'පි චෙ වාචා - අනත්ථපදසංහිතා
එකං අත්ථපදං සෙය්‍යෝ - යං සුත්වා උපසම්මති

(2x2 - ලකුණු 04යි)

(x)

- ❖ තිත්තර බ්‍රහ්මචර්යාව
- ❖ භික්ෂුවගේ යුතුකම
- ❖ උගත්කම
- ❖ ගුණවත් බව
- ❖ සැබෑ නායකයා
- ❖ මහ මඟ රහත් වීම

(1x6 - ලකුණු 06යි)

II කොටස

1.

(i)

- ❖ ස්ත්‍රී ධූර්තයෙක් නොවීම
- ❖ සුරා ධූර්තයෙක් නොවීම
- ❖ අක්ෂ ධූර්තයෙක් නොවීම
- ❖ කල්‍යාණ මිත්‍රයන් ඇසුර

(1x4 - ලකුණු 04යි)

(ii) ස්ත්‍රීන් කෙරෙහි ලොල්ව ක්‍රියා කරන තැනැත්තා ස්ත්‍රීන් සතුටු කිරීමට බොහෝ ධනය වැය කරයි. එබැවින් ඔහු ධනයෙන් පිරිහෙයි. තම බිරිඳගෙන් පමණක් සතුටුවන පුද්ගලයා උපයන ධනය රැකගනියි. යහපත් බිරිඳ එම ධනය සුරක්ෂිත කොට පවුලේ දියුණුව ඇති කරයි. සුරාවට ගිජු නොවූ තැනැත්තාගේ උපයන ධනය ආරක්ෂාවෙයි. ඔහු සාමකාමී පුද්ගලයෙක් වෙයි. සමාජයෙන් ගරු නම්බු ලබයි. ඔහු ලැජ්ජා බය ඇත්තෙකි. එසේම මනා නුවණින් ක්‍රියාකරයි. තව ද ඔහු නිරෝගී අයෙකු වේ. දූ කෙළියෙහි නොයෙදෙන තැනැත්තා ද උපයන ධනය රැකගනු ලබයි. ඔහු ද සමාජයෙහි පිළිගත් අයෙකු වේ. යහපත් ගතිගුණ ඇති මිත්‍රයන් ඇසුරුකරන අය ද දියුණුවට පත් වේ. ඔහු උපයන ධනය රැකගනියි. කල්‍යාණ මිතුරන් නිතරම අනෙකාගේ දියුණුවම ඇතිකරන බැවිනි.

මේ කරුණු ඇතුළත්ව ලියා ඇති සාර්ථක පිළිතුරට ලකුණු 6ක උපරිමයකට යටත්ව ලකුණු ප්‍රදානය කරන්න.

(ලකුණු 06යි)

(iii) සැදැහැවත් බෞද්ධයෝ ශාසනයේ ආරක්ෂාවත් භික්ෂූන් වහන්සේලාගේ පැවැත්මත් සඳහා අවංකවම ක්‍රියා කරති. සිඟාලෝවාද සූත්‍රයේ සැදැහැවත් දායකයන් භික්ෂූන් වහන්සේලාට කරුණු පහකින් සංග්‍රහ කරන බව දක්වා ඇත.

1. මෛත්‍රී සහගත කාය කර්මයෙන්
2. මෛත්‍රී සහගත වචී කර්මයෙන්
3. මෛත්‍රී සහගත මනෝ කර්මයෙන්
4. නොවසන ලද ගෙදොර ඇතිව
5. ආහාරපාන ආදිය පිළිගැන්වීමෙන්

මෙයින් ගුණාංග තුනක් දක්වා එමඟින් ගිහි පැවිදි සම්බන්ධතාවය තහවුරුවන අයුරු දක්වමින් ලියා ඇති පිළිතුරට ලකුණු 8ක උපරිමයට යටත්ව ලකුණු ප්‍රදානය කරන්න.

(ලකුණු 08යි)

2.

(i) වෛරයෙන් වෛරය කිසි කලෙකත් නොසංසිඳේ. "අසවලා මට බැණ වැදුණේය. මට ගැසීය. මා පැරදවීය. මා සතු දේ පැහැර ගත්තේය"යි සිතමින් යම් කෙනෙක් නැවත නැවත වෛර බඳීත් ද ඔවුන්ගේ වෛරය නොසංසිඳේ.

(ලකුණු 04යි)

(ii) " අසවලා මට බැන්නේය. මට ගැසීය. මා පැරදීය. මා සතු දේ පැහැර ගත්තේය' යි සිතමින් නැවත නැවත වෛර බඳින විට ඒ වෛරය නොසංසිඳේ. එකිනෙකාට දරුණු හානි කරගනිමින් භවයෙන් භවය දුකට පත්වේ. මේ පිළිබඳව අතිශයින් දුක්ඛදායක ප්‍රවෘත්තියක් කාලි යකින්නගේ කථා වස්තුවෙන් පැහැදිලි වේ. සැවැත් නුවර එක්තරා කෙළෙඹියෙක් විවාහ කරගත් බිරිය වඳ ස්ත්‍රියක් වූවා ය. එබැවින් එම කෙළෙඹි පුත්‍රයා දෙවන ස්ත්‍රියක් විවාහකරගනියි. එහිදී පළමු ස්ත්‍රිය සිතුවේ මේ ස්ත්‍රියට දරුවෙක් ලැබුනොත් තමන් නොවටිනා අයෙක් වන බවයි. එබැවින් දෙවන ස්ත්‍රියට දරු ගැබක් ඇති වූ විට එය විනාශකරන ලදී. එසේම දෙවන දැරු ගැබ ද වැනසුවාය. තෙවන දරු උපත වැනසීමට ක්‍රියාකල විට දරුවත් මවත් මරණයට පත්විය. තතුදත් මරණයට පත් ස්ත්‍රිය මිය ගියේ "මම ද මතු යකින්නියක්ව පැමිණ තීගේ දරුවනුත් නසමි" යන වෛරයෙනි. ඒ අනුව භවයෙන් භවය ඔවුනොවුන්ට හානි කරමින් දෙදෙනාම කටුක දුක් වින්ද බව දැක්වේ.

ධම්මපද නිදාන කථාවක් ඇසුරෙන් වෛර කිරීම නිසා කටුක දුක් විඳින අයුරු පහදා දී ඇති සාර්ථක පිළිතුරට ලකුණු 06ක උපරිමයකට යටත්ව ලකුණු ප්‍රදානය කරන්න.

(ලකුණු 06යි)

(iii) උපමා භාවිතයෙන් ධර්මය පහදා දීම බුදුරජාණන් වහන්සේගේ දේශනා ක්‍රමයකි. එමඟින් ඉතා ගැඹුරු දහම් කරුණු පවා පහසුවෙන් තේරුම් ගැනීමට හැකි වේ. ධම්මපදයේ ද බොහෝ ඉගැන්වීම් සඳහා උපමා යොදාගෙන ඇත.

දිසෝ දිසං යං තං කයිරා - වේරී වා පන වේරිනං
මිච්ඡා පණිහිතං චිත්තං - පාපියෝ නං තතෝ කරේ

සොරෙක් සොරෙකුට යම් නපුරක් කෙරේ ද, **එසේම** වෛර ඇති කෙනෙක් වෛරී පුද්ගලයෙකුට යම් නපුරක් කෙරේ ද, වරදවා තබන ලද සිත ඔහුට ඊටත් වඩා නපුරක් කරන්නේය.

යථාපි භමරෝ පුප්ඵං - වණ්ණගන්ධං අහේඨයං
එලේති රසමාදාය - එවං ගාමේ මුනී චරේ

යම් සේ බඹරා මලත්, එහි පැහැය හා සුවඳත් නොනසා රොන් ගෙන නැගීයේ ද එසේම මුනිවරයා ගමේ පිඬුසිඟා හැසිරෙයි.

සෙලෝ යථා එකඝනෝ
වා තෙන න සමීරති
එවං නින්දා පසංසාසු
න සමිඤ්ජන්ති පණ්ඩිතා

සිදුරු නැතිව එක සේ ඝන වූ පර්වතය සුළඟින් නොසැලෙන්නේ යම් සේ ද එමෙන්ම නුවණැත්තෝ නින්දා ප්‍රශංසාවන්හි කම්පා නොවෙති.

මෙබඳු ධම්මපද උදාහරණ තුනක්වත් දක්වමින් උපමා භාවිතයෙන් ධර්ම කරුණු පහදා දී ඇති අයුරු පෙන්වා දී ඇති සාර්ථක පිළිතුරට උපරිම ලකුණු 08කට යටත්ව ලකුණු ප්‍රදානය කරන්න.

(ලකුණු 08යි)

3.

(i)

- දානය
- ප්‍රිය වචනය
- අර්ථචර්යාව
- සමානාත්මතාව

(1x4 = ලකුණු 04යි)

අපිළිවෙලින් ලියා ඇත්නෝත් ලකුණු 02ක් ප්‍රදානය කරන්න

(ii)

දානය - තමන් සන්තක දෙයක් පූජා බුද්ධියෙන් හෝ අනුග්‍රහ බුද්ධියෙන් පරිත්‍යාග කිරීමයි.

ප්‍රිය වචනය - අනුන්ගේ හදවත පිනා යන මුදු මොළොක් බස ප්‍රිය වචනයයි.

අර්ථ චර්යාව - අන්‍යයන්ගේ හිත සුව පිණිස කාලය හා ශ්‍රමය කැප කිරීමයි.

සමානාත්මතාවය - තමන් සේම අනුන් සැලකීමයි

ලෝකයේ මේ සතර සංග්‍රහ වස්තු ගමන් කරනා රථයකට කඩ ඇණය බඳු වෙයි. මේ සතර සංග්‍රහ වස්තු නොවන්නාහු නම් මව දරුවන් නිසා බුහුමන් හෝ පිදීමක් නොලබන්නීය. පියා ද දරුවන් නිසා බුහුමන් නොලබන්නේය.

(ලකුණු 06යි)

(iii) සෞභාග්‍ය සම්පන්න, සාමකාමී යහපත් රටක් බිහිවන්නේ ජනතා හිතකාමී දැහැමි පාලකයෙකු සිටි විටයි. එබඳු පාලකයෙකු සතර සංග්‍රහ වස්තු අනුගමනය කරනු ලැබේ. ඔහු ශ්‍රමණ බමුණන්ට දන් දෙයි. දිළින්දන්, රෝගීන්, අසරණයන්ට හා මහල්ලන්ට අවශ්‍ය දේ පිරිනමයි. පෝෂණය කරයි. රාජ සේවකයන්ට හා රට වැසියන්ට අවශ්‍ය තැන පරිත්‍යාග කරයි. ප්‍රිය වචන කථාකරන රජු සියල්ලන්ට ප්‍රිය පුද්ගලයෙක් වෙයි. රට වැසියාගේ දියුණුව සඳහා කැපවී ක්‍රියා කිරීම අර්ථචර්යාවයි. තමා මෙන්ම අනුන් ද එක සේ සළකා ක්‍රියා කිරීම සමානාත්මතාවයයි. ඒ අනුව තමා මෙන්ම අන්‍යයන්ද දුක් විඳීමට අකමැති බවත් සැප ලැබීමට කැමති බවත් වටහාගනු ලබන පාලකයා ජනතාව අතර ගරු බුහුමන් ලබයි.

(මේ කරුණු ද සමඟ සිඟාලෝවාද සූත්‍රයෙහ දක්වමින් වෙනත් කරුණු ද දක්වමින් දැහැමි පාලකයෙකුට ඉන් ලැබෙන මඟ පෙන්වීම පහදා දී ඇති සාර්ථක පිළිතුරට ලකුණු 8ක උපරිමයට යටත්ව ලකුණු ප්‍රදානය කරන්න)

(ලකුණු 08යි)

4.

(i) **පෙර වස් විසීම** - ඇසළ මස පුර පසළොස්වක පොහොයට පසු දිනය/ පෑලවියදා

පසු වස් විසීම - නිකිණි පුර පසළොස්වක පොහෝ දිනට පසු දිනය/ පෑලවියදා

(ලකුණු 04යි)

(ii) වස්සාන සමයෙහි පළමු තුන් මස අවසන්ව එළඹෙන හයවන පොහොය වන වප් පසළොස්වක පෙහෝ දින පෙර වස් විසූ භික්ෂූන් ද සත්වන පොහොය යෙදෙන තුදුස්වක දින පසු වස් විසූ භික්ෂූන් ද පවාරණ විනය කර්මය කරනු ලැබේ. මේ විනය කර්මයට සියලු සමාන සංවාසික සංඝයා රැස්වේ. රැස්ව ධාර්මිකව හා සමඟිව විනය කර්මය සිදුකරති. එහිදී ගතවූ වස්කාලය තුළ ත්‍රිවිධරද්වාරයෙන් සිදු වූ වරදක් දුටුවේ - ඇසුවේ හෝ සැක කළේ නම් ඊට පිළියම් කරගැනීමට අනුකම්පාවෙන් පෙන්වාදෙන ලෙස ආයාචනා කරයි. එය පවාරණයයි. ගිලන් භික්ෂුවක් වෙතොත් උන්වහන්සේ තම පවාරණය වෙනත් භික්ෂුවක් මඟින් සංඝයාට දැන්විය යුතු ය. ඇවතට පත් භික්ෂූන්ට මේ විනය කර්මයට එක්විය නොහැක.

මේ ක්‍රියාවලිය තුළින් සංඝ සමඟිය හා සුහදත්වයත් පාරිශුද්ධියත් සිදුවන අයුරු පහදා දුන් සාර්ථක පිළිතුරට ලකුණු 06ක උපරිමයකට යටත්ව ලකුණු ප්‍රදානය කරන්න.

(ලකුණු 06යි)

(iii) වස් කාලය එළඹෙත්ම භික්ෂූන් වහන්සේට සිව් පසයෙන් වස් කාලය තුළ උපස්ථාන කරන බව ප්‍රකාශ කරමින් දායකවරු වස් ආරාධනා කරති. එතැන් සිට නිතර විහාරස්ථානයට පැමිණෙන දායක පිරිස විවිධ පින්කම් කරති. බුද්ධ පූජා, බෝධි පූජා, ධර්ම දේශනා හා ධර්ම සාකච්ඡා පවත්වති. එසේම විහාරයේ භෞතික දියුණුව ද සුබසාධන ද කරති. මේ නිසා වස් කාලය තුළ පැවිදි ගිහි සම්බන්ධය දියුණු වේ.

අනතුරුව කඨින චීවර පූජා සමය පැමිණේ. මෙම පින්කම හා බැඳුනු චාරිත්‍ර රාශියක් ඇත. කඨින සිවුර මැසීම, පෙරහැර, සාංඝික දාන, ධර්ම දේශනා ආදියයි. භික්ෂූන් වහන්සේගේ උපදෙස් ද ලබමින් මෙම ආගමික කටයුතුවල නිරතවීම නිසා පැවිදි ගිහි සම්බන්ධ තවදුරටත් තහවුරු වේ.

(මෙම කරුණු ද ඇතුළත්ව සාර්ථක ලියා ඇති පිළිතුරට ලකුණු 08ක උපරිමයට යටත්ව ලකුණු ප්‍රදානය කරන්න)

(ලකුණු 08යි)

5.

(i)

- ❖ උත්සාහය
- ❖ උපායශීලී බව
- ❖ ඥාති සංග්‍රහය
- ❖ අනුගාමිකයන්ගේ සැප විහරණය
- ❖ තමන් කළ යහපත් ක්‍රියා ගැන සිතා සතුටුවීම

(කරුණු දෙකක් සඳහා 2x2 = ලකුණු 04යි)

(ii) බෝසත් වඳුරු රජු තම පිරිසේ දියුණුව සඳහා කැපවී ක්‍රියා කරයි. මරබියෙන් සිටි එම පිරිසේ දිවි බේරාදීමට දැඩි උත්සාහයෙන් හා ජීවිත පරිත්‍යාගයෙන් ක්‍රියා කරයි. රසවත් අඹ අනිකෙකු කෑ විට තමාට සිදුවන හානිය කලින්ම දැන ගඟට වැටෙන ගෙඩි මල් විනාශ කිරීම, රජු හා පිරිස නිදිගත් විට අඹ ගසට නැඟ අඹ කෑම හා තම පිරිස බේරා ගැනීමට යෙදූ උපාය බෝසත් වඳුරු රජුගේ උපායශීලී බව ප්‍රකට කරයි. බෝසත් වඳුරු නායකයා තම ඥාති වර්ගයා පෝෂණය කිරීම හා රැකවරණය ලබා දීම මඟින් ඥාති සංග්‍රහ කරයි. තමාගේ සැප විහරණය නොසළකා තම පිරිසේ ආහාර හා සැපත වෙනුවෙන් ක්‍රියා කරයි. දුෂ්ට වඳුරා තමාට කළ හිංසා ගැන නොසිතා වඳුරු පිරිසේ දිවි ගලවා දීම පිළිබඳව වඳුරු නායකයා සතුටු වෙයි. "මට ඒ බැම්ම වේදනාවට හේතු නොවීය. ඒ පහර ද මා නොතවන්නේය. මම යම් පිරිසකට රජකම් කළේ නම් ඒ පිරිසට සැප ගෙනදුන්නෙමි"

වඳුරු නායකයා තුළ පැවති චරිත ලක්ෂණ දෙකක් දක්වා උසස් ජීවිතයක් ගොඩනඟා ගැනීමට උනන්දුවන පුද්ගලයෙකුට එම චරිත ලක්ෂණ අනුගමනය කිරීමේ වැදගත්කම විස්තර කොට ඇති සාර්ථක පිළිතුරට උපරිම ලකුණු 06 කට යටත්ව ලකුණු ප්‍රදානය කරන්න.

(ලකුණු 06යි)

(iii) ශාස්තෘන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසද්දී නෑයන්ගේ යහපත පිණිස ක්‍රියා කිරීම මුල්කොට වදාළහ. වස්තුව භද්දසාල ජාතකයෙහි ප්‍රකට වන්නේය. එකල භික්ෂූහු දම් සභාවෙහි කථාවක් ඇති කළහ. "ඇවැත්නි බුදුරජාණන් වහන්සේ නෑයන්ගේ යහපත පිණිස ක්‍රියාකරන සේක." යනුවෙනි. බුදුරජාණන් වහන්සේ එහි වැඩම කොට දැන් ඔබ මෙහි කවර කථාවක් කරමින් හුන්නාහු දැයි විමසුයේ "ස්වාමීනි මෙනම් කථා වෙන්නයි කී කල්හි" "මහණෙනි, දැන් පමණක් නොව පෙරත් තථාගතයන් වහන්සේ ඥාතීනගේ යහපත පිණිස ක්‍රියාකළ සේකැයි" වදාරා අතීත කථාව ගෙනහැර දැක්වූහ/දැක්වීය.

(ලකුණු 08යි)

6.

(i)

- සාලිකෙදාර ජාතකය
- මාතු පෝසක ජාතකය

(ලකුණු 04යි)

(ii) මව් පිය දූ දරු සෙනෙහස තුළ සමගිය, සමාදානය, කරුණාව, මෛත්‍රිය ආදී අධ්‍යාත්මික බැඳීම් රාශියක් පවතියි. මව් පියෝ දරුවන්ගේ අභිවෘද්ධිය සඳහා ජීවිත පරිත්‍යාගයෙන් ක්‍රියා කරති. මහලු ගිරා රජු රජ සැප තම පුත් බෝසත් ගිරවාට ලබාදෙන්නේ එබැවිනි. බෝසත් ගිරා රජු ද මව් පියන්ට කෑම සොයන්නට යාමට නොදී තමාම ආහාර ගෙනෙවිත් දෙමව්පියන් පෝෂණය කරයි. මාතු පෝෂක ජාතක කතාවේ ද දැක්වෙන්නේ බෝසත් ඇත් රජු මහත් දයාවෙන් තම අන්ධ මව පෝෂණය කරන ප්‍රවෘත්තියයි. ගිරා රජු මෙන්ම බෝසත් ඇත් රජු ද සතුරන් අල්වා ගත් විට දෙදෙනාම වැළපෙන්නේ මව් පියන් අසරණ වීම නිසාය. ඔවුන්ගේ මව් පියෝ ද දරුවන්ට දුකක් ඇතිවීයයි සිතා බලවත් සේ දුක්වෙති. දරුවන් නිදහස්ව මව් පියන් වෙත පැමිණිවිට ඒ මව හා පියා බලවත් සේ සතුටුවෙති.

(මව් පියන් හා දරුවන් අතර පවත්නා අධ්‍යාත්මික බැඳීම තුළින් ගොඩනැඟෙන නිරාමිෂවූත් පිවිතුරුවූත් සුන්දරත්වය අගයකරමින් ලියා ඇති සාර්ථක පිළිතුරට ලකුණු 06ක උපරිමයකට යටත්ව ලකුණු ප්‍රදානය කරන්න)

(ලකුණු 06යි)

(iii) ශාස්තෘන් වහන්සේ ඒ භික්ෂුව කැඳවා "මහණ ඔබ ගිහියන් පෝෂණය කරති'යි යන්න සැබෑවක්ද'යි" අසා "සැබෑවකි ස්වාමීනී'යි " කී කල ඔවුහු ඔබට කවුරුන් වෙත්දැයි ඇසූ විට "මගේ මව් පිය දෙදෙනය ස්වාමීනි"යි කී කල්හි "මහණ ඉතා හොඳයි, පැරණි පඬුවෝ තිරිසනුන්ව ගිරා ජාතියෙහි ඉපිද පවා මහලු මවුපියන් කැදැල්ලෙහි තබා මුව තුඩින් ගොදුරු ගෙනවුත් පෝෂණය කළාහුයි"ය කියා අතීත කථාව ගෙනහැර දැක්වූහ.

(ලකුණු 08යි)

7.

(i)

(අ) එකල්හි භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ පා වැන්දාහුය.

(ආ) උපාසකයා දන් දී සිල් රැක දෙව් ලොව උපන්නේය.

(ඉ) අතීතයෙහි රජගහ නුවර මගධ නම් රජෙක් රාජ්‍ය කරවීය.

(ඊ) ස්ත්‍රිය යාචකයන්ට ආහාර දුන්නාය.

(ලකුණු 08යි)

(ii)

(අ) අහං පාඨශාලං ගන්ත්වා උග්ගණ්හාමි.

(ආ) තුම්හෙ සත්තා/තිරච්ඡාන මා මාරෙථ.

(ඉ) අහං පූජෙමි බුද්ධං කුසුමෙන නෙන/පූජේමි බුද්ධං කුසුමෙනනෙන

(ඊ) භිකඛු ධම්මං දේසේතුං ගාමං ගච්ඡිස්සති/ගමිස්සති

(උ) සා දේවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.

(ලකුණු 10යි)

******

PAST PAPERS WIKI

WWW.PastPapersWiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library